

# සංස්කෘත ශබ්දමාලා



Dedicated

BY SPECIAL PERMISSION

TO

HIS EXCELLENCY

*THE RIGHT HON'BLE*

SIR W. H. GREGORY K. C. M. G.

GOVERNOR AND COMMANDER IN CHIEF IN AND OVER THE

*ISLAND OF CEYLON*

AND THE DEPENDENCIES THEREOF

*&c. &c. &c.*

BY

HIS EXCELLENCY'S MOST OBEDIENT SERVANTS

THE AUTHORS

සංස්කෘත ශබ්දමාලා

නම්වූ මෙම පොත

සර් විලියම් හැන්රි ග්‍රැගොරි

ලඞකාවේ ආණ්ඩුකාර උතුමානන්වහන්සේ විසින්

පිළිගන්නා ලදී.

THE

# SANSKRIT ŚABDAMĀLĀ

OR

## DECLENSIONS OF SANSKRIT NOUNS

BY THE PANDIT

REVD. RATMALĀNE DHARMĀLŌKA

TERUNNĀNSE

STYLED "THE LEARNED AUTHOR"

BY H. R. H, THE PRINCE OF WALES

AND HIS PUPIL

REVD. K. DHARMĀRĀMA UNNĀNSE

OF

RATMALANA PURANA VIHARA

AND

VIDYĀLANKĀRA COLLEGE, PELIYAGODA

NEAR THE KELANI STATION

PUBLISHED BY

N. S. FERNANDO SECRETARY

OF

THE DHARMAPARAYANA SOCIETY

COLOMBO.

PRINTED AT THE SASTRALOKA PRESS,

1876

# දැන්වීමයි.

සංස්කෘත ව්‍යාකරණ උගන්නා කැමැත්තන්ගේ සුඛාවබොධයපිණිස "සත්‍යසමුච්චය" නම් ප්‍රකරණයෙහි ඉතා පැහැදිලිලෙස සංස්කෘත ව්‍යාකරණවිධිද, කර්තෘකර්ම ක්‍රියාලක්ෂණ හා පාණිනි සූත්‍රවෘත්ති ක්‍රමයෙන් විස්තරකරණලද කාරක විපර්‍ය්‍යාස සහිතවූ 'පදමඤ්ජරී' අර්ථව්‍යාඛ්‍යානයද, විභක්ති රූප දැනගන්නා පිණිස ශබ්ද වරනගන ක්‍රමයද, මසක් පාසා ප්‍රසිද්ධකලනුමුත් එය නිෂ්ඨාවට නොපැමිණ අඩාලවැ නැවති තිබෙනබැවින් මෙහි අත්සන්කරණ අප ආදි බොහෝදෙනෙකුගේ ආරාධනාවෙන්ලොකානුකම්පාවෙන්ම එම "සත්‍යසමුච්චය"ද සාදාදුන්නාවූ-පැලියගොඩ විද්‍යාලඞ්කාර ශාස්ත්‍රශාලාවේ ආචාර්‍ය්‍යභාවොපගත රත්මලානේ පුරාණවිහාරාධිවාසී පණ්ඩිතාචාර්‍ය්‍ය රත්මලානේධර්මාලොක ස්වාමිපාදයන්වහන්සේ සහ තච්ඡිෂ්‍යවූ-ධර්මාරාම ස්වාමීන්විසින්ද, සංස්කෘත උගන්නාකැමැත්තන්ට ගුඩවූ සම්පූර්ණවූ සංස්කෘත ශබ්දමාලාවක් නොහොත් වරනැගිල්ලක් සපයාගැණීමට නැතිබැවින්-පාණිනීය,චාන්ද්‍ර,සාරස්වත,මුග්ධබොධාදි ව්‍යාකරණ ග්‍රන්ථයන් මනාලෙස අවලොකනය කොට අතිසඞ්ක්ෂෙප අතිවිස්තරහැර ග්‍රහණධාරණයට පහසු පරිද්දෙන් කරණලද මෙම "සංස්කෘත ශබ්දමාලාව" වෛද්‍ය නක්ෂත්‍ර ව්‍යාකරණ ඡන්දොලඞ්කාරාදි ශාස්ත්‍ර ඉගෙණීමට පූර්වභාගයෙහි පුහුණුකටයුතුම වූ පොතක්බැවින් මෙහිපහතඅත්සන්කරණ අපවිසින් ලෝවැඩසඳහා අච්චුගස්වනලදි—මේසමග සාදනලද සංස්කෘත ආඛ්‍යාත වරනැගිල්ල පොත මහත්වනබැවින් මේවරට අච්චු නොගැස්වූ නුමුත් අප්‍රමාදව අච්චුගස්වනබව දතයුතුයි—

මේවගට,

N. S. FERNANDO.

# PREFACE.

Sanskrit Grammar, including the Active and Passive Voices of Verbs together with a paraphrase of Pada Manjari according to the Sutras or Rules of Panini and expositions thereof as also declensions of Nouns were published in a Monthly Periodical entitled the *Satya Samuchchaya* for the use of those who were anxious to study the Sanskrit language.

The Periodical however was obliged to be discontinued before the whole of what was intended to be placed before the beginner was published. Nevertheless at the request of the undersigned and many others, the learned Pandit the Revd. RATMALANE DHARMALOKA TERUNNANSE, Master of Vidyalankara College at Peliyagoda and his Pupil the Revd. DHARMARAMA UNNANSE under whose kind patronage the *Satya Samuchchaya* was conducted, have since composed the *Sabdamala* with the same object. The Authors have carefully consulted Paniniya Chandra, Sarasvata, Mugdhabodha and other works on Grammar and have composed the above without being either too abstruse or too elaborate, but in a manner easy of acquisition. And as a complete and correct work on the Sanskrit Declensions in Sinhalese is not procurable, which is a *Sine quâ non* for those who are entering on the study of Medicine, Astronomy, Grammar, Prosody Rhetoric &c. we the undersigned have published the same for the benefit of the world,

The part on Sanskrit Conjugations which is composed in like manner but was not printed, to prevent the work being too bulky, will also be published without delay

N. S. FERNANDO

Colombo,

29th October 1876

---

# ABBREVIATIONS.

| | | | |
|---|---|---|---|
| *S.* | *SINGULAR.* | *ACC,* | *ACCUSATIVE.* |
| *D.* | *DUAL.* | *I.* | *INSTRUMENTAL.* |
| *P.* | *PLURAL.* | *D.* | *DATIVE.* |
| *C.* | *CASES.* | *ABL.* | *ABLATIVE.* |
| *N.* | *NOMINATIVE.* | *G.* | *GENITIVE.* |
| *V.* | *VOCATIVE,* | *L.* | *LOCATIVE.* |

## THE AUTHORS' PRAYER.

The following is a Sanskrit composition named Muktaka Kavya composed in Sardulawikridita Tune, praying Providencial assistance to Her, Most Excellent Majesty Queen Victoria of Great Britain and Ireland and to His Excellency the Governor of the Island of Ceylon.

ශ්‍රීලඞ්කාභ්‍රමිතො කෘතෙන්දු වදසද්ධ්වාන්තක්‍ෂතිං චාපිසත්
කුන්දොජ්ජෘම්භ මමාත්‍ය භෛඃ සහයථා රාඥිමතං රඤ්ජයන්,
නිඝ්නන්විඝ්න මවාමරෙන්ද්‍ර සුචිරං තංතාංච වික්ටොරියාං
ශ්‍රීමන්තංසරූපාධියුක්ත විලියම් හැන්රිග්‍රෑගොරිං නෘපම්.

*Srilankabhra mito kritendu vadasaddhwanta kshatin chapisat*
*Kundojjrimbhamamatya bhaih sahayatha rajnimatam ranjayan*
*Nighnanvighna mavamarendra suchiram tamtamcha Viktoriyam*
*Srimantam sarupadhi yukta Wiliyam Henri Gregorim nripam*

Has any one at the command and pleasure of a great Queen, arrived at the Heavens like Prosperous Lanka, surrounded by star like ministers, and having made himself beloved by his subjects, repelled the darkness like wickedness, and gladdened the *Kunda* (Jasmine ?) like rightious men? That Most Excellent Queen Victoria and His Excellency Sir William Henry Gregory, O! God Supreme! protect for a long time to come from all evils,

*CORRECTIONS.*

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙල. | වරද. | නිවරද. |
|---|---|---|---|
| I | 22 | කියයුතුතැන | කීතැන |
| 1 | 4 | ප්‍රභවාංං | ප්‍රභවාං |
| ,, | 14 | චතුඊථි | චතුර්ථි |
| 2 | 23 | ගජගන | ගජ්ශන |
| 3 | 2 | ධ්වනී | ධ්වනි |
| 37 | 15 | ෂුතාශීඃ | ෂුතාශීඃ |
| 40 | 22 | ප්‍රි | පු |
| 41 | 4 | සව | සව |
| 47 | 25 | නපුංශක | නපුංසක |
| 45 | 19 | බහුවචනාන්තඃ | ඒ වචනාන්තඃ |
| ,, | 26 | {එතදඃ ච, එතද් ශබ්දයාගෙ(රූපය)} | එතදඃරූපංච, එතද් ශබ්දයාගේ රූපය. |

# පදාන්ත කියනක්‍රමය.

නරඃ, යනු අකාරාන්තපුංලිඞ්ගකෘදන්ත ලිඞ්ගාර්ථයෙහිසිද්ධ වූ ප්‍රථමෛකවචනාන්ත සුබන්තපදය.

නරෞ, යනු අකාරාන්තපුංලිඞ්ගකෘදන්ත ලිඞ්ගාර්ථයෙහි සිද්ධවූ ප්‍රථමා ද්විවචනාන්ත සුබන්තපදය.

නරාඃ, යනු අකාරාන්තපුංලිඞ්ගකෘදන්ත ලිඞ්ගාර්ථයෙහිසිද්ධවූ ප්‍රථමා බහුවචනාන්ත සුබන්තපදය.

(හෙ)නර, යනු අකාරාන්තපුංලිඞ්ගකෘදන්ත ආමන්ත්‍රණාර්ථයෙහි සිද්ධවූ සම්බොධනෛක වචනාන්ත සුබන්තපදය.

නරම්, යනු අකාරාන්ත පුංලිඞ්ගකෘදන්ත කර්මකාරකයෙහි සිද්ධවූ ද්විතීයෛකවචනාන්ත සුබන්තපදය.

නරෙණ, යනු අකාරාන්තපුංලිඞ්ගකෘදන්ත කර්තෘකාරකයෙහි සිද්ධවූ තෘතීයෛක වචනාන්ත සුබන්තපදය.

නරාය, යනු අකාරාන්ත පුංලිඞ්ගකෘදන්ත සම්ප්‍රදාන කාරකයෙහි සිද්ධවූචතුර්ථ්‍යෛකවචනාන්ත සුබන්තපදය.

නරාත්, යනු අකාරාන්ත පුංලිඞ්ගකෘදන්ත අපාදාන කාරකයෙහි සිද්ධවූ පඤ්චම්‍යෛක වචනාන්තසුබන්තපදය.

නරස්‍ය, යනු අකාරාන්ත පුංලිඞ්ගකෘදන්ත සම්බන්ධාර්ථයෙහි සිද්ධවූ ෂෂ්ඨ්‍යෛකවචනාන්ත සුබන්තපදය.

නරෙ, යනු අකාරාන්තපුංලිඞ්ගකෘදන්ත අධාරකාරකයෙහි සිද්ධවූ සප්තම්‍යෛක වචනාන්ත සුබන්තපදය.

මෙහි "ඒකවචනාන්ත" යයි කියයුතුතැන ද්විවචනයෙහිදී "ද්විවචනාන්ත" කියාද බහුවචනයෙහිදී "බහුවචනාන්ත" කියාද යෙදියයුතුයි—'සමාසාන්ත—තද්ධිතාන්ත' ශබ්දවලදී "කෘදන්ත"යි නොකියා "සමාසාන්ත" "තද්ධිතාන්ත" යයි කියයුතුයි—

# පදාර්ථ කියනක්‍රමය.

නරඃ, මනුෂ්‍යතෙම; නරෞ, මනුෂ්‍යයෝදෙදෙනෙක්තුමූ; නරාඃ, මනුෂ්‍යයෝතුමූ; (හෙ)නර, (පින්වත්) මනුෂ්‍යය; (හෙ) නරෞ, (පින්වත්) මනුෂ්‍යයෝ දෙදෙන; (හෙ) නරාඃ, (පින්වත්) මනුෂ්‍යයෙනි; නරම්, මනුෂ්‍යයා; නරෞ, මනුෂ්‍යයන් දෙදෙනා; නරාන්, මනුෂ්‍යයන්; නරෙණ, මනුෂ්‍යයාවිසින්, නරාභ්‍යාම්, මනුෂ්‍යයන් දෙදෙනෙක්විසින්; නරෛඃ, මනුෂ්‍යයන් විසින්; නරාය, මනුෂ්‍යයාහට, නරාභ්‍යාම්, මනුෂ්‍යයන්දෙදෙනෙකුන්ට; නරෙභ්‍යඃ, මනුෂ්‍යයන්ට; නරාත්, මනුෂ්‍යයා

නමස්තස්මෛ භගවතෙ'ර්හතෙ
සම්‍යක් සම්බුද්ධාය.

ලක්ෂ්මණොපගතවානඛිලානමුනීන්ද්‍රඃ,
ශාබ්දානු මිත්‍යුපමිතිප්‍රභවාංශ්චයො'ර්ථාන්.
ප්‍රත්‍යක්ෂතස්ත මභිවන්ද්‍ය කරොමි බාල,
ධී වෘද්ධයෙසුගම සාඥාත ශබ්ද මාලාම්

## අකාරාන්ත පුංලිඞ්ගො නරශබ්දඃ.

| ඒකවචන. SINGULAR. | ද්විවචන. DUAL. | බහුවචන. PLURAL. | විභක්ති. CASES. | |
|---|---|---|---|---|
| නරඃ | නරෞ | නරාඃ | ප්‍රථමා-(ලිඞ්ගාර්ථ) * | NOM. |
| (හෙ)නර | (හෙ)නරෞ | (හෙ)නරාඃ | සම්බොධන-(ආමන්ත්‍රණ) | VOC. |
| නරම් | නරෞ | නරාන් | ද්විතීයා-(කර්මකාරක) | ACC. |
| නරෙණ | නරාභ්‍යාම් | නරෛඃ | තෘතීයා-(කර්තෘකාරක) † | INST. |
| නරාය | නරාභ්‍යාම් | නරෙභ්‍යඃ | චතුර්ථී-(සම්ප්‍රදානකාරක) | DAT. |
| නරාත් | නරාභ්‍යාම් | නරෙභ්‍යඃ | පඤ්චමී-(අපාදානකාරක) | ABL. |
| නරස්‍ය | නරයොඃ | නරාණාම් | ෂෂ්ඨී-(සම්බන්ධ) | GEN. |
| නරෙ | නරයොඃ | නරෙෂු | සප්තමී-(ආධාරකාරක) | LOC. |

"නර"ශබ්දයෙන් මනුෂ්‍යයන් කියත්

* පාණිනියෙහි "ප්‍රාතිපදිකාර්ථ ලිඞ්ගපරිමාණ වචනමාත්‍රෙ ප්‍රථමා" යනු දැක්වූහෙයින් "ප්‍රාතිපදිකාර්ථ" යයිදු කියයුතුයි.

† "කර්තෘ කරණ යොස්තෘතීයා" යනු පාණිනි සූත්‍රහෙයින් 'කරණ කාරක' යෙහිද 'තෘතීයා' විභක්තිය වෙයි.

චන්ද්‍රාමරාජ ජනමානව දානවේනා
ඉන්ද්‍රානිලාබ්ද සුගතාර්‍ය්‍ය මුනීන්ද්‍ර රාමාඃ,
න්‍යග්‍රෝධ නිම්බ වරුණාම්‍ර ගජාශනාගාස්-
තාර්ක්ෂ්‍යාදයශ්ච විදිතා ඉතිපුංස්‍ය දන්තාඃ *

## වසන්තතිලකානම්.

### ඉකාරාන්ත පුංලිඞ්ගඃ කවිශබ්දඃ.

| ඒකවචන. SINGULAR. | ද්විවචන. DUAL. | බහුවචන. PLURAL. | විභක්ති. CASES. | |
|---|---|---|---|---|
| කවිඃ | කවී | කවයඃ | ප්‍රථමා-(ලිඞ්ගාර්ථ) | NOM. |
| (හෙ)කවෙ | (හෙ)කවී | (හෙ)කවයඃ | සම්බෝධන-(ආමන්ත්‍රණ) | VOC. |
| කවිම් | කවී | කවීන් | ද්විතීයා-(කර්මකාරක) | ACC. |
| කවිනා | කවිභ්‍යාම් | කවිභිඃ | තෘතීයා-(කර්තෘකාරක) | INST. |
| කවයෙ | කවිභ්‍යාම් | කවිභ්‍යඃ | චතුර්ථී-(සම්ප්‍රදානකාරක) | DAT. |
| කවෙඃ | කවිභ්‍යාම් | කවිභ්‍යඃ | පඤ්චමී-(අපාදානකාරක) | ABL. |
| කවෙඃ | කව්‍යොඃ | කවීනාම් | ෂෂ්ඨී-(සම්බන්ධ) | GEN. |
| කවෞ | කව්‍යොඃ | කවිෂු | සප්තමී-(ආධාරකාරක) | LOC. |

"කවි" ශබ්දයෙන් පණ්ඩිතයන් කියත්

---

* චන්ද්‍ර, චන්ද්‍රය; අමර, දෙවියෝය; අජ, බ්‍රහ්මය; ජන, සත්වය; මානව, මනුෂ්‍යය; දානව, අසුරය; ඉනාඃ, සූර්‍ය්‍යය; ඉන්ද්‍ර, ශක්‍රය; අනිල, වාතය; අබ්ද, මේඝය; සුගත, සර්වඥය; ආර්‍ය්‍ය, උත්තමය; මුනීන්ද්‍ර, විෂ්ණුය; රාමාඃ, (දශරථපුත්‍රවූ)එනම් රජය; න්‍යග්‍රෝධ, නුගය; නිම්බ, කොසඹය; වරුණ, ලුණුවරණය; ආම්‍ර, අඹගසය; ගජාශන, බෝගසය; අගාඃ, වෘක්ෂයෝය; තාර්ක්ෂ්‍ය, ගරුඩපක්ෂියා; (යන) ආදයශ්ච, (මේ) ආදිවූද; පුංසිඅදන්තාඃ, පුල්ලිඞ්ග අකාරාන්ත ශබ්දයෝ; ඉති, මෙසේ; (මේ නරශබ්දය මෙන්;)විදිතාඃ, දන්නා ලද්දාහුය

අපි රවි ගරයඃ—පවි ගිරි නිධයඃ,
ඪවනි මණි විධයඃ—කලි රපි කවිවත් *—මධුමනි නාමී.

---

උකාරාන්ත පුංලිඞ්ගඃ සාධුශබ්දඃ.

| ඒකවචන. SINGULAR. | ද්විවචන. DUAL. | බහුවචන. PLURAL. | විභක්ති: CASES. | |
|---|---|---|---|---|
| සාධුඃ | සාධූ | සාධවඃ | ප්‍රථමා-(ලිඞ්ගාර්ථ) | NOM. |
| (හෙ)සාධො | (හෙ)සාධූ | (හෙ)සාධවඃ | සම්බොධන-(ආමන්ත්‍රණ) | VOC. |
| සාධුම් | සාධූ | සාධූන් | ද්විතීයා-(කර්මකාරක) | ACC. |
| සාධුනා | සාධුභ්‍යාම් | සාධුභිඃ | තෘතීයා-(කර්තෘකාරක) | INST. |
| සාධවෙ | සාධුභ්‍යාම් | සාධුභ්‍යඃ | චතුර්ථී-(සම්ප්‍රදානකාරක). | DAT. |
| සාධොඃ | සාධුභ්‍යාම් | සාධුභ්‍යඃ | පඤ්චමී-(අපාදානකාරක) | ABL. |
| සාධොඃ | සාධ්වොඃ | සාධූනාම් | ෂෂ්ඨී-(සම්බන්ධ) | GEN. |
| සාධෞ | සාධ්වොඃ | සාධුෂු | සප්තමී-(ආධාරකාරක) | LOC. |

"සාධු" ශබ්දයෙන් සත්පුරුෂයන් කියත්—

එවමෙතු ධාතු තන්තු—ජන්තු වායු ජායවශ්‍රව,
බන්ධු මායු මන්‍යු භානු—සින්ධු වොණු රුද යොපි †—
සමානීකානාම්.

---

* අපි, එළිවෝය; රවි, සූර්‍ය්‍යය; ගරයඃ, විෂණය; පවි, වජ්‍රය; ගිරි, පර්වතය; නිධයඃ, [පද්මශඞ්ඛාදි] නිධිහුය; ඪවනි, ශබ්දය; මණි, මාණික්‍යය; විධයඃ, බ්‍රහ්මය; කලිඃ අපි, බුළු ගසඳැයි [යනාදි ශබ්දද;]කවිවත්, කවිශබ්දයමෙනි—

† ඔතු, විඩාලය හෙවත් බළලාය; ධාතු, ධාතුහුය; තන්තු, සූත්‍රය හෙවත් හුය; ජන්තු ප්‍රාණිහුය, වායු, වාතය; ජායවශ්‍රව, ඖෂධය යනා මොහුද; බන්ධු, නෑයෝය; මායු, පිතය; මන්‍යු, සමාරෞ ... භානු, සූර්‍ය්‍යය; සින්ධවඃ, සමුද්‍රය; අණුඃ, ක්ෂුද්‍රය; ආද ශබ්දයෝද; එවම්, මෙසේමැයි; (හෙවත් 'සාධු, වගෙයු—

ඍකාරාන්ත පුංලිඞ්ග ධාතෘ ශබ්දඃ.

| එකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. | |
|---|---|---|---|---|
| ධාතා | ධාතාරෞ | ධාතාරඃ | ප්‍රථමා– (ලිඞ්ගාර්ථ) | N. |
| (හෙ)ධාතඃ | (හෙ)ධාතාරෞ | [හෙ]ධාතාරඃ | සම්බොධන– (ආමන්ත්‍රණ) | V. |
| ධාතාරම් | ධාතාරෞ | ධාතෲන් | ද්විතීයා– (කර්මකාරක) | ACC. |
| ධාත්‍රා | ධාතෘභ්‍යාම් | ධාතෘභිඃ | තෘතීයා– (කර්තෘකාරක) | I. |
| ධාත්‍රෙ | ධාතෘභ්‍යාම් | ධාතෘභ්‍යඃ | චතුර්ථී–(සම්ප්‍රදානකාරක) | D. |
| ධාතුඃ | ධාතෘභ්‍යාම් | ධාතෘභ්‍යඃ | පඤ්චමී–(අපාදානකාරක) | ABL. |
| ධාතුඃ | ධාත්‍රොඃ | ධාතෲණාම් | ෂෂ්ඨී– (සම්බන්ධ) | G. |
| ධාතරි | ධාත්‍රොඃ | ධාතෘෂු | සප්තමී–(ආධාරකාරක) | L. |

"ධාතෘ" ශබ්දයෙන් බ්‍රහ්මයා කියත්—

එවං ශාස්තෘ කර්තෘ නප්තෘාදයඃ. *

---

ඍකාරාන්ත පුංලිඞ්ගඃ පිතෘශබ්දඃ.

| එකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| පිතා | පිතරෞ | පිතරඃ | ප්‍ර— (ලි)— N. |
| (හෙ)පිතඃ | (හෙ)පිත[illegible]රෞ | (හෙ)පිතරඃ | සම්—(ආ)—V. |
| පිතරම් | පිතරෞ | පිතෲන් | ද්වි— (ක)—ACC |

සෙස්ස 'ධාතෘ' ශබ්දය්මෙනි—

"පිතෘ"ශබ්දයෙන් පියානන් කියත්—

එවං—ජාමාතෘ භ්‍රාතෘාදයඃ † —

---

* ශාස්තෘ, සර්වඥය; කර්තෘ, කර්තෘය; නප්තෘ, මුනුබුරා; ආදයඃ, මේආදි ශබ්දයෝ; එවම්, මෙසේමැයි—

† ජාමාතෘ, (දුවගේසැමිවූ) බෑනාය; භ්‍රාතෘ, සහෝදරයා; ආදයඃ, මේආදිශබ්දයෝ; එවම්, මෙසේමැයි.

ඔකාරාන්ත පුංලිඞ්ගා ගොශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| ගෞඃ | ගාවෞ | ගාවඃ | ප්‍ර— (ලි)—N. |
| [හෙ]ගෞඃ | [හෙ]ගාවෞ | [හෙ]ගාවඃ | සම්- (ආ)—V. |
| ගාම් | ගාවෞ | ගාඃ | ද්වි— (කා)—ACC. |
| ගවා | ගොභ්‍යාම් | ගොභිඃ | තෘ—(ක)—I. |
| ගවෙ | ගොභ්‍යාම් | ගොභ්‍යඃ | ච— (ස)—D. |
| ගොඃ | ගොභ්‍යාම් | ගොභ්‍යඃ | ප— (අ)—ABL. |
| ගොඃ | ගවොඃ | ගවාම් | ෂ— (ස)—G. |
| ගවි | ගවොඃ | ගොෂු | ස— (අ)—L. |

"ගො" ශබ්දයෙන් ගෙරින් කියත්—

එවං ස්මෘතො ප්‍රභෘතයඃ. *

ඉත්‍යජන්ත පුංලිඞ්ග සාමාන්‍යශබ්දඃ—

---

අථාජන්ත පුංලිඞ්ග විශෙෂ ශබ්දඃ.

අකාරාන්ත පුංලිඞ්ගඃ ප්‍රථම ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C |
| ප්‍රථමඃ | ප්‍රථමෞ | {ප්‍රථමෙ / ප්‍රථමාඃ} | ප්‍ර— (ලි)N. |
| [හෙ]ප්‍රථම | (හෙ)ප්‍රථමෞ | {[හෙ)ප්‍රථමෙ / (හෙ)ප්‍රථමාඃ} | සම්—(ආ)V. |

ශෙෂං නරශබ්දවත්—

"ප්‍රථම" ශබ්දයෙන් පළමුවෙනිය යන අර්ථ කියත්—

---

* ස්මෘතො ප්‍රභෘතයඃ, ස්මෘතෝති ශබ්දය ආදිකොට ඇති ශබ්දයෝ; එවම්, මෙසේමැයි—

"ස්මෘතඃ උඃ යෙනසඃ ස්මෘතෝඃ"—ස්මෘතඃ, සිහිකරණලද; උඃ, ඊශ්වරතෙම; යෙන, යමක්හු විසින්ද; සඃ, හෙතෙම, ස්මෘතොඃ, ස්මෘතොනම්.

මෙය "අතද්ගුණ සංවිඥානක" බහු ව්‍රීහි නාමයකි.

එවං චරමා 'ල්පා' ර්ධකති පයාඃ තයාය ප්‍රත්‍යයාන්තා ද්විතය ත්‍රිතය ද්වය ත්‍රයාදයශ්ච *—

ද්විතීයශබ්දො, නරශබ්දවත්—

චතුර්ථි විභක්ති මාරභ්‍යවිශෙෂඃ—

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ද්විතීයස්මෛ<br>ද්විතීයාය | ද්විතීයාභ්‍යාම් | ද්විතීයෙභ්‍යඃ | ච—(ස)—*D.* |
| ද්විතීයස්මාත්<br>ද්විතීයාත් | ද්විතීයාභ්‍යාම් | ද්විතීයෙභ්‍යඃ | ප—(අ)—*ABL.* |
| ද්විතීයස්‍ය | ද්විතීයයොඃ | ද්විතීයානාම් | ෂ—(ස)—*G.* |
| ද්විතීයස්මින්<br>ද්විතීයෙ | ද්විතීයයොඃ | ද්විතීයෙෂු | ස—(ආ)—*L.* |

එවන්තෘතීයඃ †—

අකාරාන්ත පුංලිඞ්ගො නිර්ජර ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| නිර්ජරඃ | නිර්ජරෞ<br>නිර්ජරසෞ | නිර්ජරාඃ<br>නිර්ජරසඃ | ප්‍ර— (ලි)—*N.* |
| (හෙ)නිර්ජර | (හෙ)නිර්ජරෞ<br>(හෙ)නිර්ජරසෞ | (හෙ)නිර්ජරාඃ<br>(හෙ)නිර්ජරසඃ | සම්—(ආ)—*V.* |
| නිර්ජරම්<br>නිර්ජරසම් | නිර්ජරෞ<br>නිර්ජරසෞ | නිර්ජරාන්<br>නිර්ජරසඃ | ද්වි— (ක)-*ACC.* |

* චරම, පශ්චිමය; අර්ධ, අර්ධය; කතිපයාඃ, කිපය හෙවත් සඞ්ඛ්‍යා දැනීම පිණිස විචාරීමය; (යනමේ ශබ්දද;)තයාය ප්‍රත්‍යයාන්තාඃ, තයාය ප්‍රත්‍යයන් අන්තවූ; ද්විතය, දෙකාය; ත්‍රිතය, තුනය; ද්වය, දෙකාය; ත්‍රය, තුනය; ආදයශ්ච, මෙආදි ශබ්දයෝද; එවම්, මෙසේයි—මෙහි "තයාය ප්‍රත්‍යය" නම්—පාණිනියෙහි "සංඛ්‍යායාඅවයවෙතයප්" යන සූත්‍රයෙන්හා "ද්විත්‍රිභ්‍යාන්ත යස්‍යායජ්වා" යන සූත්‍රයෙන්ද දක්වන 'තයප්' ප්‍රත්‍යය හා 'අයච්' ප්‍රත්‍යයයි—

† ද්විතීය, දෙවෙනි; තෘතීය, තුන්වෙනි.

| | | | |
|---|---|---|---|
| නිර්ජරෙණ<br>නිර්ජරසා | * නිර්ජරාභ්‍යාම් | නිර්ජරෛඃ | තෘ—(ක)—*I.* |
| නිර්ජරාය<br>නිර්ජරසෙ | නිර්ජරාභ්‍යාම් | නිර්ජරෙභ්‍යඃ | ච—(ස)—*D.* |
| නිර්ජරාත්<br>නිර්ජරසඃ | නිර්ජරාභ්‍යාම් | නිර්ජරෙභ්‍යඃ | ප—(අ)—*ABL.* |
| නිර්ජරස්‍ය<br>නිර්ජරසඃ | නිර්ජරයොඃ<br>නිර්ජරසොඃ | නිර්ජරාණාම්<br>නිර්ජරසාම් | ෂ—(ස)—*G.* |
| නිර්ජරෙ<br>නිර්ජරසි | නිර්ජරයොඃ<br>නිර්ජරසොඃ | නිර්ජරෙෂු | ස—(අ)—*L.* |

"නිර්ජර" ශබ්දයෙන් දෙවියන් කියත්—

---

ආකාරාන්ත පුංලිඞ්ග විශ්වපා ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| විශ්වපාඃ | විශ්වපෞ | විශ්වපාඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)විශ්වපාඃ | (හෙ)විශ්වපෞ | (හෙ)විශ්වපාඃ | සම්—(ආ)—*V.* |
| විශ්වපාම් | විශ්වපෞ | විශ්වපඃ | ද්වි—(ක)—*ACC.* |
| විශ්වපා | විශ්වපාභ්‍යාම් | විශ්වපාභිඃ | තෘ—(ක)—*I.* |
| විශ්වපෙ | විශ්වපාභ්‍යාම් | විශ්වපාභ්‍යඃ | ච—(ස)—*D.* |
| විශ්වපඃ | විශ්වපාභ්‍යාම් | විශ්වපාභ්‍යඃ | ප—(අ)—*ABL.* |
| විශ්වපඃ | විශ්වපොඃ | විශ්වපාම් | ෂ—(ස)—*G.* |
| විශ්වපි | විශ්වපොඃ | විශ්වපාසු | ස—(අ)—*L.* |

"විශ්වපා" ශබ්දයෙන් සියල්ල රක්නේය යන අර්ථකියත්.

එවං ශඞ්ඛධ්මාගන්ධඥා 'දයඃ †—

---

* "ජරායා ජරසමන්‍යතරස්‍යාම්" යන සූත්‍රයෙන් 'ජරස්' ආදෙශයකළ කල්හි "ටා-ඞසි" යන විභක්ති දෙක්හි 'නිර්ජරසින' 'නිර්ජරසාත්' කියාවෙයි 'නිර්ජරසා' 'නිර්ජරසඃ' සී නොවෙයි 'භිස්' විභක්තියෙහි 'නිර්ජරසෛඃ' කියාද වෙයි 'ඞස්' විභක්තියෙහි 'නිර්ජරස්‍ය' යන රූපයම වෙයි—යන මේ සියල්ල සමහරුන්ගේ මතනුමුත් භාෂ්‍යයට විරුඬබැවින් බැහැර කරණලදී—

† ශඞ්ඛධ්මා, සක්පිඹින්නාය; ගන්ධඥා, ගඳ ආඝ්‍රාණය කරන්නාය; ආදයඃ, [මේ] ආදී ශබ්දයෝද; එවම්, මෙසේමැයි—

ආකාරාන්ත පුංලිඞ්ග හාහා ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| හාහාඃ | හාහෞ | හාහාඃ | ප්‍ර— (ලි)—*N.* |
| (හෙ)හාහාඃ | (හෙ)හාහෞ | (හෙ)හාහාඃ | සම්— (ආ)—*V.* |
| හාහාම් | හාහෞ | හාහාන් | ද්වි— (ක)—*ACC.* |
| හාහා | හාහාභ්‍යාම් | හාහාභිඃ | තෘ— (ක)—*I.* |
| හාහෛ | හාහාභ්‍යාම් | හාහාභ්‍යඃ | ච— (ස)—*D.* |
| හාහාඃ | හාහාභ්‍යාම් | හාහාභ්‍යඃ | පං— (අ)—*ABL.* |
| හාහාඃ | හාහෞඃ | හාහාම් | ෂ— (ස)—*G.* |
| හාහෙ | හාහෞඃ | හාහාසු | ස— (ආ)—*L.* |

"හාහා" ශබ්දයෙන් එනම් ගන්ධර්ව විශේෂයක් කියත්෴

---

ඉකාරාන්ත පුංලිඞ්ගඃ සඛි ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| සඛා | සඛායෞ | සඛායඃ | ප්‍ර— (ලි—*N.* |
| (හෙ)සඛෙ | (හෙ)සඛායෞ | (හෙ)සඛායඃ | සම්— (ආ)—*V.* |
| සඛායම් | සඛායෞ | සඛීන් | ද්වි— (ක)—*ACC.* |
| සඛ්‍යා | සඛිභ්‍යාම් | සඛිභිඃ | තෘ— (ක)—*I.* |
| සඛ්‍යෙ | සඛිභ්‍යාම් | සඛිභ්‍යඃ | ච— (ස)—*D.* |
| සඛ්‍යුඃ | සඛිභ්‍යාම් | සඛිභ්‍යඃ | පං— (අ)—*ABL.* |
| සඛ්‍යුඃ | සඛ්‍යොඃ | සඛීනාම් | ෂ— (ස)—*G.* |
| සඛ්‍යෞ | සඛ්‍යොඃ | සඛිෂු | ස— (ආ)—*L.* |

"සඛි" ශබ්දයෙන් මිත්‍රයන් කියත්෴

---

පතිශබ්දෙ සමස්තඃ කවිශබ්දවත්෴
තෘතීයා විභක්ති මාරභ්‍ය විශෙෂඃ෴

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| පත්‍යා * | පතිභ්‍යාම් | පතිභිඃ | තෘ— (ක)—*I.* |

* පාණිනීයෙහි "පතිඃ සමාස එව" යන්නෙන් සමාසයෙහිම 'පති' ශබ්දයාගේ 'ඝිත්ව' ය දැක්වූ නමුත් සමහර තැනක අසමාසයෙහිද 'ඝිත්ව' ය කැමතිවන හෙයින් ස්මෘති පුරාණවල 'තෘතීයා චතුර්ථී-සප්තමී' එක වචනයෙහි ක්‍රමයෙන් 'පතිනා පතයෙ-පතෞ' කියාද යොදනලද බැව් පෙනේ෴

| | | | |
|---|---|---|---|
| පත්‍යෙ | පතිභ්‍යාම් | පතිභ්‍යඃ | ච—(තු)—D. |
| පත්‍යුඃ | පතිභ්‍යාම් | පතිභ්‍යඃ | ප—(ඤ්)—ABL. |
| පත්‍යුඃ | පත්‍යොඃ | පතීනාම් | ෂ—(ෂ්)—G. |
| පත්‍යෞ | පත්‍යොඃ | පතිෂු | ස—(ප්)—L. |

"පති" ශබ්දයෙන් ස්වාමීන් කියත්—

සමාසෙතු ශ්‍රීපති ශබ්දාදයඃ කවිශබ්දවදෙව—

ඩති ප්‍රත්‍යයාන්තාඃ කති යති ප්‍රභෘතයො නිත්‍යං බහුවචනාන්තාඃ—

කති, කති, කතිභිඃ, කතිභ්‍යඃ, කතිභ්‍යඃ, කතීනාම්, කතිෂු.

"කති" ශබ්දය සංඛ්‍යා විශෙෂ දැනිම පිණිස විචාරිමෙහි කියත්—

එවං යති *

ඊකාරාන්ත පුංලිඞ්ගා වාතප්‍රමී ශබ්දඃ—

| එකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| වාතප්‍රමීඃ | වාතප්‍රම්‍යෞ | වාතප්‍රම්‍යඃ | ප්‍ර—(ථ)—N. |
| (හෙ) වාතප්‍රමීඃ | (හෙ) වාතප්‍රම්‍යෞ | (හෙ) වාතප්‍රම්‍යඃ | සම්—(බො)—V. |
| වාතප්‍රමීම් † | වාතප්‍රම්‍යෞ | වාතප්‍රමීන් | ද්වි—(තී)—ACC. |
| වාතප්‍රම්‍යා | වාතප්‍රමීභ්‍යාම් | වාතප්‍රමීභිඃ | තෘ—(තී)—I. |
| වාතප්‍රම්‍යෙ | වාතප්‍රමීභ්‍යාම් | වාතප්‍රමීභ්‍යඃ | ච—(තු)—D. |
| වාතප්‍රම්‍යඃ | වාතප්‍රමීභ්‍යාම් | වාතප්‍රමීභ්‍යඃ | ප—(ඤ්)—ABL. |
| වාතප්‍රම්‍යඃ | වාතප්‍රම්‍යොඃ | වාතප්‍රම්‍යාම් | ෂ—(ෂ්)—G. |
| වාතප්‍රමී | වාතප්‍රම්‍යොඃ | වාතප්‍රමීෂු | ස—(ප්)—L. |

"වාතප්‍රමී" ශබ්දයෙන් වාතමෘගයන් කියත්—

එවංයයී පප්‍යාදයඃ ‡—

* යති, (යම්ප්‍රමාණය යන අර්ථ ඇති) යති ශබ්දයද; එවම් මෙසේයි—

† වාතප්‍රමී ශබ්දය 'ක්විප්' ප්‍රත්‍යයාන්තවූ කල්හි ද්විතීයෙක වචනයෙහි 'වාතප්‍රම්‍යම්' කියාද—ද්විතීයා බහුවචනයෙහි 'වාතප්‍රම්‍යඃ' කියාද—සප්තම්‍යෙක වචනයෙහි 'වාතප්‍රම්‍යි' කියාද වෙයි—

‡ යයී, මාර්ගය—පපී, සූර්‍ය්‍යයා—

ඊකාරාන්ත. පුංලිඞ්ගඃ සුධී ශබ්දඃ—

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| සුධීඃ | සුධියෞ | සුධියඃ | ප්‍ර-- (ලි)—*N.* |
| (හෙ)සුධීඃ | (හෙ)සුධියෞ | (හෙ)සුධියඃ | සම්-(ආ)--*V.* |
| සුධියම් | සුධියෞ | සුධියඃ | ද්වි-- (ක)-*ACC.* |
| සුධියා | සුධීභ්‍යාම් | සුධීභිඃ | තෘ- (ක)--*I.* |
| සුධියෙ | සුධීභ්‍යාම් | සුධීභ්‍යඃ | ච— (ස)--*D.* |
| සුධියඃ | සුධීභ්‍යාම් | සුධීභ්‍යඃ | ප— (අ)-*ABL.* |
| සුධියඃ | සුධියොඃ | සුධියාම් | ෂ— (ස)--*G.* |
| සුධියි | සුධියොඃ | සුධීෂු | ස— (ආ)—*L.* |

"සුධී" ශබ්දයෙන් පණ්ඩිතයන් කියත්—

එවං සුශ්‍රී යවක්‍රාදයඃ * —

ඊකාරාන්ත පුංලිඞ්ගඃ ප්‍රධී ශබ්දඃ—

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ප්‍රධීඃ | ප්‍රධ්‍යෞ | ප්‍රධ්‍යඃ | ප්‍ර— (ලි)—*N.* |
| (හෙ)ප්‍රධීඃ | (හෙ)ප්‍රධ්‍යෞ | (හෙ)ප්‍රධ්‍යඃ | සම්-(ආ)—*V.* |
| ප්‍රධ්‍යම් | ප්‍රධ්‍යෞ | ප්‍රධ්‍යඃ | ද්වි— (ක)-*ACC.* |
| ප්‍රධ්‍යා | ප්‍රධීභ්‍යාම් | ප්‍රධීභිඃ | තෘ- (ක)—*I.* |
| ප්‍රධ්‍යෙ | ප්‍රධීභ්‍යාම් | ප්‍රධීභ්‍යඃ | ච-- (ස)—*D.* |
| ප්‍රධ්‍යඃ | ප්‍රධීභ්‍යාම් | ප්‍රධීභ්‍යඃ | ප-- (අ)-*ABL.* |
| ප්‍රධ්‍යඃ | ප්‍රධ්‍යොඃ | ප්‍රධ්‍යාම් | ෂ— (ස)—*G.* |
| ප්‍රධ්‍යි | ප්‍රධ්‍යොඃ | ප්‍රධීෂු | ස— (ආ)--*L.* |

"ප්‍රධී" ශබ්දයෙන් ප්‍රාඥයන් කියත්—

එවං සපීශී දූධී ප්‍රභෘතයඃ †—

සෙනානීශබ්දඃ ‡ ප්‍රධී ශබ්දවත්—

---

* සුශ්‍රී, මනාශ්‍රීඇත්තේ—යවක්‍රී, යව මිළදී ගන්නේ.

† සපාද්බිභෙතිති සපීශීඃ—දුෂ්ටංධ්‍යායතිති දූධීඃ-සපාත්, සපු ගෙන්; බිහෙති ඉති, බියවේනුයි; සපීශීඃ, සපීශීනම්;—දුෂ්ටම්, අයහපත්කොට; ධ්‍යායති ඉති, සිතානුයි; දූධීඃ, දූධීනම්.

‡ සාරස්වත ව්‍යාකරණයෙහි-"සෙනාන්‍යාදීනාංවාමොනුඩ්ව ක්තව්‍යඃ" යන්නෙන් 'ආම්' විභක්තියට විකල්පයෙන් "නුඩා ගමය" දැක්වූහෙයින් සෙනානී ශබ්දයෙහි "සෙනාන්‍යාම්—සෙනානීනාම්" යි මෙසේ බහුවචන රූප දෙකක් වෙත්.

සප්තම්‍යෙක වචනෙ විශෙෂඃ—

| | | | |
|---|---|---|---|
| සෙනාන්‍යාම් | සෙනාන්‍යොඃ | සෙනානීෂු | ස—(ආ)—L. |

"සෙනානී" ශබ්දයෙන් සෙනාපතීන් කියත්—

එවං ග්‍රාමණ්‍ය ග්‍රණ්‍යාදයඃ * —

උකාරාන්ත පුංලිඞ්ගඃ ක්‍රොෂ්ටු ශබ්දඃ.

| එකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| ක්‍රොෂ්ටා | ක්‍රොෂ්ටාරෞ | ක්‍රොෂ්ටාරඃ | ප්‍ර—(ලි)—N. |
| (හෙ)ක්‍රොෂ්ටො | (හෙ)ක්‍රොෂ්ටාරෞ | (හෙ)ක්‍රොෂ්ටාරඃ | සම්-(ආ)-V. |
| ක්‍රොෂ්ටාරම් | ක්‍රොෂ්ටාරෞ | ක්‍රොෂ්ටූන් | ද්වි—(ක)-ACC. |
| ක්‍රොෂ්ට්‍රා<br>ක්‍රොෂ්ටුනා | ක්‍රොෂ්ටුභ්‍යාම් | ක්‍රොෂ්ටුභිඃ | තෘ-(ක)—I. |
| ක්‍රොෂ්ට්‍රෙ<br>ක්‍රොෂ්ටවෙ | ක්‍රොෂ්ටුභ්‍යාම් | ක්‍රොෂ්ටුභ්‍යඃ | ච—(ස)—D. |
| ක්‍රොෂ්ටුඃ<br>ක්‍රොෂ්ටොඃ | ක්‍රොෂ්ටුභ්‍යාම් | ක්‍රොෂ්ටුභ්‍යඃ | ප—(අ)-ABL. |
| ක්‍රොෂ්ටුඃ<br>ක්‍රොෂ්ටොඃ | ක්‍රොෂ්ට්‍රොඃ<br>ක්‍රොෂ්ට්වොඃ | ක්‍රොෂ්ටූනාම් | ෂ—(ස)—G. |
| ක්‍රොෂ්ටරි<br>ක්‍රොෂ්ටෞ | ක්‍රොෂ්ට්‍රොඃ<br>ක්‍රොෂ්ට්වොඃ | ක්‍රොෂ්ටුෂු | ස—(ආ)—L. |

"ක්‍රොෂ්ටු" ශබ්දයෙන් සිවලුන් කියත්—

උකාරාන්ත පුංලිඞ්ගඃ ඛලපූශබ්දඃ.

| එකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| ඛලපූඃ | ඛලප්වෞ | ඛලප්වඃ | ප්‍ර--(ලි)--N. |
| (හෙ)ඛලපූඃ | (හෙ)ඛලප්වෞ | (හෙ)ඛලප්වඃ | සම්-(ආ)-V. |
| ඛලප්වම් | ඛලප්වෞ | ඛලප්වඃ | ද්වි—(ක)-ACC. |
| ඛලප්වා | ඛලපූභ්‍යාම් | ඛලපූභිඃ | තෘ-(ක)--I. |
| ඛලප්වෙ | ඛලපූභ්‍යාම් | ඛලපූභ්‍යඃ | ච—(ස)—D. |
| ඛලප්වඃ | ඛලපූභ්‍යාම් | ඛලපූභ්‍යඃ | ප—(අ)-ABL. |
| ඛලප්වඃ | ඛලප්වොඃ | ඛලප්වාම් | ෂ—(ස)—G. |
| ඛලප්වි | ඛලප්වොඃ | ඛලපූෂු | ස—(ආ)—L. |

"ඛලපූ" ශබ්දයෙන් කලවිටි ශුඩකරන්නවුන් කියත්—

---

* { ග්‍රාමණී / අග්‍රණී } ශ්‍රෙෂ්ඨය (යනඅර්ථයි)

එවං සුලවාදයො වඞ්ඖගු පුනඞ්ඩු දන්හවාදයශ්ච * ——

ඌකාරාන්ත පුංලිඞ්ගඃ සච්යම්භූ ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| ස්වයම්භූඃ | ස්වයම්භුවෞ | ස්වයම්භුවඃ | ප්‍ර—(ලි)—N. |
| [හෙ]ස්වයම්භූඃ | [හෙ] ස්වයම්භුවෞ | [හෙ]ස්වයම්භුවඃ | සම්-(ආ)—V. |
| ස්වයම්භුවම් | ස්වයම්භුවෞ | ස්වයම්භුවඃ | ද්වි--(ක)-ACC. |
| ස්වයම්භුවා | ස්වයම්භූභ්‍යාම් | ස්වයම්භූභිඃ | තෘ-(ක)-I. |
| ස්වයම්භුවෙ | ස්වයම්භූභ්‍යාම් | ස්වයම්භූභ්‍යඃ | ච—(ස)-D. |
| ස්වයම්භුවඃ | ස්වයම්භූභ්‍යාම් | ස්වයම්භූභ්‍යඃ | ප—(අ)-ABL. |
| ස්වයම්භුවඃ | ස්වයම්භුවොඃ | ස්වයම්භුවාම් | ෂ—(ස)- G. |
| ස්වයම්භුවි | ස්වයම්භුවොඃ | ස්වයම්භූෂු | ස—(ආ)- L. |

"ස්වයම්භූ" ශබ්දයෙන්බ්‍රහ්මයා කියත් ——

එවමාත්මභූ ස්වභූ ප්‍රභෘතයඃ † ——

භූ භූ ශබ්දඃ බලපූශබ්දවත් —— විතියායාං විශෙෂඃ ——

| | | | |
|---|---|---|---|
| භූ භූම් | භූභෞ | භූ භූන් | ද්වි--(ක)-ACC. |

"භූ භූ" ශබ්දයෙන් ගන්ධර්වවිශෙෂයක් කියත් ——

ඍකාරාන්ත පුංලිඞ්ගා නෘශබ්දඃ ——

| එකවචන, | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| නා | නරෞ | නරඃ | ප්‍ර--(ලි)—N. |
| [හෙ] නඃ | [හෙ]නරෞ | [හෙ]නරඃ | සම්-(ආ)--V. |
| නරම් | නරෞ | නෘන් | ද්වි-- (ක)-ACC. |
| න්‍රා | නෘභ්‍යාම් | නෘභිඃ | තෘ-(ක)—I. |
| න්‍රෙ | නෘභ්‍යාම් | නෘභ්‍යඃ | ච--- (ස)--D. |
| නුඃ | නෘභ්‍යාම් | නෘභ්‍යඃ | ප—(අ)- ABL. |
| නුඃ | න්‍රොඃ | { නෘණාම් / නෘණාම් } | ෂ--(ස)--G. |
| නරි | න්‍රොඃ | නෘෂු | ස--(ආ)--L. |

"නෘ" ශබ්දයෙන් මිනිසුන් කියත් ——

---

* සුලූ, මනාකොට සිඳින්නාය;—වඞ්ඖභූ, මැඩියාය;—පුනඞ්ඩු, නැවත භවගත්තේය;-දෘන්භූ, සූයඞ්ඩය ——

† ආත්මභූ, අනඞ්ගයා;-ස්වභූ, බ්‍රහ්මයා ——

ඖකාරාන්ත පුංලිඞ්ගො ග්ලෞශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ග්ලෞඃ | ග්ලාවෞ | ග්ලාවඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]ග්ලෞඃ | [හෙ]ග්ලාවෞ | [හෙ]ග්ලාවඃ | සම්-(ආ)—*V.* |
| ග්ලාවම් | ග්ලාවෞ | ග්ලාවඃ | ද්වි—(ක)-*ACC.* |
| ග්ලාවා | ග්ලෞභ්‍යාම් | ග්ලෞභිඃ | තෘ-(ක)—*I.* |
| ග්ලාවෙ | ග්ලෞභ්‍යාම් | ග්ලෞභ්‍යඃ | ච—(ස)—*D.* |
| ග්ලාවඃ | ග්ලෞභ්‍යාම් | ග්ලෞභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| ග්ලාවඃ | ග්ලාවොඃ | ග්ලාවාම් | ෂ—(ස)—*G.* |
| ග්ලාවි | ග්ලාවොඃ | ග්ලෞෂු | ස—(ආ)—*L.* |

"ග්ලෞ" ශබ්දයෙන් චන්ද්‍රයා කියත්—

උක්තා අජන්ත පුංලිඞ්ග විශෙෂ ශබ්දාඃ.

ඉත්‍යජන්තාඃ පුංලිඞ්ගාඃ—

---

අථ හලන්ත පුංලිඞ්ග සාමාන්‍යශබ්දාඃ—

හකාරාන්ත පුංලිඞ්ගො මධුලිහ් ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| මධුලිඩ්<br>මධුලිට් | මධුලිහෞ | මධුලිහඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]මධුලිඩ්<br>[හෙ]මධුලිට් | [හෙ]මධුලිහෞ | [හෙ]මධුලිහඃ | සම්-(ආ)—*V.* |
| මධුලිහම් | මධුලිහෞ | මධුලිහඃ | ද්වි—(ක)-*ACC.* |
| මධුලිහා | මධුලිඩ්භ්‍යාම් | මධුලිඩ්භිඃ | තෘ-(ක)—*I.* |
| මධුලිහෙ | මධුලිඩ්භ්‍යාම් | මධුලිඩ්භ්‍යඃ | ච—(ස)—*D.* |
| මධුලිහඃ | මධුලිඩ්භ්‍යාම් | මධුලිඩ්භ්‍යඃ | ප—(අ)-*ABL.* |
| මධුලිහඃ | මධුලිහොඃ | මධුලිහාම් | ෂ—(ස)—*G.* |
| මධුලිහි | මධුලිහොඃ | මධුලිට්සු * | ස—(ආ)—*L.* |

"මධුලිහ්" ශබ්දයෙන් භෘඞ්ගයන් කියත්—

එවම් පුෂ්පලිහාදයඃ † —

---

* 'මධුලිහ්' මිත්‍රද්‍රුහ්, ආදිශබ්දයන්ගෙ සප්තමී බහුවචනයෙහි පක්ෂයෙක්හි "මධුලිට්ත්සු" "මිත්‍රධ්‍රුට්ත්සු" කියාත් වේ—

† 'පුෂ්පලිහ්' භෘඞ්ගයා.

හකාරාන්ත පුංලිඞ්ග මිත්‍රද්‍රුහ් ශබ්දඃ

| ඒකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
| --- | --- | --- | --- |
| මිත්‍රධ්‍රුග්<br>මිත්‍රධ්‍රුක්<br>මිත්‍රධ්‍රුඩ්<br>මිත්‍රධ්‍රුට් | මිත්‍රද්‍රුහෞ | මිත්‍රද්‍රුහඃ | ප්‍ර— (ලි)—N. |
| [හේ]මිත්‍රධ්‍රුග්<br>[හේ]මිත්‍රධ්‍රුක්<br>[හේ]මිත්‍රධ්‍රුඩ්<br>[හේ]මිත්‍රධ්‍රුට් | [හේ]මිත්‍රද්‍රුහෞ | [හේ]මිත්‍රද්‍රුහඃ | සම්-(ආ)—V. |
| මිත්‍රද්‍රුහම් | මිත්‍රද්‍රුහෞ | මිත්‍රද්‍රුහඃ | ද්වි— (ක) ACC. |
| මිත්‍රද්‍රුහා | මිත්‍රධ්‍රුග්භ්‍යාම්<br>මිත්‍රධ්‍රුඩ්භ්‍යාම් | මිත්‍රධ්‍රුග්භිඃ<br>මිත්‍රධ්‍රුඩ්භිඃ | තෘ-(ක)—I. |
| මිත්‍රද්‍රුහේ | මිත්‍රධ්‍රුග්භ්‍යාම්<br>මිත්‍රධ්‍රුඩ්භ්‍යාම් | මිත්‍රධ්‍රුග්භ්‍යඃ<br>මිත්‍රධ්‍රුඩ්භ්‍යඃ | ච—(ස)—D. |
| මිත්‍රද්‍රුහඃ | මිත්‍රධ්‍රුග්භ්‍යාම්<br>මිත්‍රධ්‍රුඩ්භ්‍යාම් | මිත්‍රධ්‍රුග්භ්‍යඃ<br>මිත්‍රධ්‍රුඩ්භ්‍යඃ | ප—(අ)-ABL. |
| මිත්‍රද්‍රුහඃ | මිත්‍රද්‍රුහෝඃ | මිත්‍රද්‍රුහාම් | ෂ—(ස)—G. |
| මිත්‍රද්‍රුහි | මිත්‍රද්‍රුහෝඃ | මිත්‍රධ්‍රුක්ෂු<br>මිත්‍රධ්‍රුට්සු | ස- (ආ)—L. |

"මිත්‍රද්‍රුහ්" ශබ්දයෙන් මිත්‍රද්‍රෝහීන් කියත්.

එවං තාම්‍රචූහාදයඃ *

නකාරාන්ත පුංලිඞ්ග රාජන් ශබ්දඃ.

| ඒකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
| --- | --- | --- | --- |
| රාජා | රාජානෞ | රාජානඃ | ප්‍ර— (ලි)—N. |
| (හේ)රාජන් | (හේ)රාජානෞ | (හේ)රාජානඃ | සම්-(ආ)—V. |
| රාජානම් | රාජානෞ | රාඥඃ | ද්වි— (ක)-ACC. |
| රාඥා | රාජභ්‍යාම් | රාජභිඃ | තෘ-(ක)—I. |
| රාඥේ | රාජභ්‍යාම් | රාජභ්‍යඃ | ච— (ස)—D. |
| රාඥඃ | රාජභ්‍යාම් | රාජභ්‍යඃ | ප— (අ)-ABL. |
| රාඥඃ | රාඥෝඃ | රාඥාම් | ෂ— (ස)—G. |
| රාඥි<br>රාජනි | රාඥෝඃ | රාජසු | ස—(ආ)—L. |

"රාජන්" ශබ්දයෙන් රජුන් කියත්.

---

* තාම්‍රචූග්,-තඹයෙහි මුළාවන්නේ.

එවං සුත්‍රාමන් මඝිමන් ප්‍රභෘතයඃ *—

නකාරාන්ත පුංලිඞ්ග ආත්මන්ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| ආත්මා | ආත්මානෞ | ආත්මානඃ | ප්‍ර— (ලි)—N. |
| (හෙ) ආත්මන් | (හෙ)ආත්මානෞ | (හෙ)ආත්මානඃ | සම්-(ආ)—V. |
| ආත්මානම් | ආත්මානෞ | ආත්මනඃ | ද්වි— (ක)-ACC. |
| ආත්මනා | ආත්මභ්‍යාම් | ආත්මභිඃ | තෘ- (ක)—I. |
| ආත්මනෙ | ආත්මභ්‍යාම් | ආත්මභ්‍යඃ | ච— (ස)—D. |
| ආත්මනඃ | ආත්මභ්‍යාම් | ආත්මභ්‍යඃ | ප— (අ)-ABL. |
| ආත්මනඃ | ආත්මනොඃ | ආත්මනාම් | ෂ— (ස)—G. |
| ආත්මනි | ආත්මනොඃ | ආත්මසු | ස— (ආ)—L. |

"ආත්මන්" ශබ්දයෙන් ආත්මය කියත්—

එවං සුධර්මන් බ්‍රහ්මන් ප්‍රභෘතයඃ †—

නකාරාන්ත පුංලිඞ්ගා ධනින්ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| ධනී | ධනිනෞ | ධනිනඃ | ප්‍ර— (ලි)-N. |
| (හෙ)ධනින් | (හෙ)ධනිනෞ | (හෙ)ධනිනඃ | සම්-(ආ)—V. |
| ධනිනම් | ධනිනෞ | ධනිනඃ | ද්වි— (ක)-ACC. |
| ධනිනා | ධනිභ්‍යාම් | ධනිභිඃ | තෘ-(ක)—I. |
| ධනිනෙ | ධනිභ්‍යාම් | ධනිභ්‍යඃ | ච— (ස)—D. |
| ධනිනඃ | ධනිභ්‍යාම් | ධනිභ්‍යඃ | ප— (අ)-ABL. |
| ධනිනඃ | ධනිනොඃ | ධනිනාම් | ෂ—(ස)—G. |
| ධනිනි | ධනිනොඃ | ධනිෂු | ස—(ආ)—L. |

"ධනින්" ශබ්දයෙන් ධනඇත්තවුන් කියත්—

එවං ශූනින් ගුණින් කරින් යශස්වින් වාග්මින් ප්‍රභෘතයඃ. ‡

* සුත්‍රාමන්,—ශක්‍රයා;—මඝිමන්,—මඝිමය; (ඊශ්වරයාගේ එනම් ඓශ්වර්යයක්.)

† සුධර්මන්,-කෙළෙඹියා;—බ්‍රහ්මන්,-බ්‍රහ්මයා.

‡ ශූනින්,-සුවනැත්තේ,—ගුණින්,-ගුණඇත්තේ;-කරින්,-සොඬඇත්තේ;(හෙවත් හස්තිහුය)—යශස්වින්,-යශස් ඇත්තේ;—වාග්මින්,-ප්‍රශස්ත වචනඇත්තේ.

### ජකාරාන්තපුංලිඞ්ගො භිෂජ්ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| භිෂක්<br>භිෂග් | භිෂජෞ | භිෂජඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)භිෂක්<br>(හෙ)භිෂග් | (හෙ)භිෂජෞ | (හෙ)භිෂජඃ | සම්-(ආ)—*V.* |
| භිෂජම් | භිෂජෞ | භිෂජඃ | ද්වි—(ක)-*ACC.* |
| භිෂජා | භිෂග්භ්‍යාම් | භිෂග්භිඃ | තෘ-(ක)—*I.* |
| භිෂජෙ | භිෂග්භ්‍යාම් | භිෂග්භ්‍යඃ | ච—(ස)—*D.* |
| භිෂජඃ | භිෂග්භ්‍යාම් | භිෂග්භ්‍යඃ | ප—(අ)-*ABL.* |
| භිෂජඃ | භිෂජොඃ | භිෂජාම් | ෂ—(ස)—*G.* |
| භිෂජි | භිෂජොඃ | භිෂක්ෂු | ස—(ආ)—*L.* |

"භිෂජ්" ශබ්දයෙන් වෙදුන් කියත්—

එවං ඍත්විජ් තනුත්‍යජ් ප්‍රභෘතයඃ * —

### දකාරාන්ත පුංලිඞ්ගො දිවිෂද්ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| දිවිෂත් | දිවිෂදෞ | දිවිෂදඃ | ප්‍ර--(ලි)--*N.* |
| (හෙ)දිවිෂත් | (හෙ)දිවිෂදෞ | (හෙ)දිවිෂදඃ | සම්-(ආ)-*V.* |
| දිවිෂදම් | දිවිෂදෞ | දිවිෂදඃ | ද්වි---(ක)-*ACC.* |
| දිවිෂදා | දිවිෂද්භ්‍යාම් | දිවිෂද්භිඃ | තෘ-(ක)--*I.* |
| දිවිෂදෙ | දිවිෂද්භ්‍යාම් | දිවිෂද්භ්‍යඃ | ච—(ස)--*D.* |
| දිවිෂදඃ | දිවිෂද්භ්‍යාම් | දිවිෂද්භ්‍යඃ | ප---(අ)-*ABL.* |
| දිවිෂදඃ | දිවිෂදොඃ | දිවිෂදාම් | ෂ—(ස)--*G.* |
| දිවිෂදි | දිවිෂදොඃ | දිවිෂත්සු | ස--(ආ)--*L.* |

"දිවිෂද්" ශබ්දයෙන් දෙවියන් කියත්—

එවං ක්‍රව්‍යාද් වෙදවිදාදයඃ † —

### චකාරාන්ත පුංලිඞ්ගො ජලමුච්ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ජලමුග්<br>ජලමුක් | ජලමුචෞ | ජලමුචඃ | ප්‍ර—(ලි)--*N.* |

---

* ඍත්විජ්,-යාගකර්තෘ;—තනුත්‍යජ්,-ශරීරය පුදන්නා.

† ක්‍රව්‍යාද්, රකුසු;—වෙදවිද්, වෙදයදන්නේ.

| | | | |
|---|---|---|---|
| [හෙ]ජලමුග් / [හෙ]ජලමුක් | [හෙ]ජලමුචෞ | [හෙ]ජලමුචඃ | සම්—(ආ)—V. |
| ජලමුචම් | ජලමුචෞ | ජලමුචඃ | ද්වි—(කා) ACC. |
| ජලමුචා | ජලමුග්භ්‍යාම් | ජලමුග්භිඃ | තෘ—(කා)—I. |
| ජලමුචෙ | ජලමුග්භ්‍යාම් | ජලමුග්භ්‍යඃ | ච—(සං)—D. |
| ජලමුචඃ | ජලමුග්භ්‍යාම් | ජලමුග්භ්‍යඃ | ප—(අ)—ABL. |
| ජලමුචඃ | ජලමුචොඃ | ජලමුචාම් | ෂ—(සං)—G. |
| ජලමුචි | ජලමුචොඃ | ජලමුක්ෂු | ස—(ආ)—L. |

"ජලමුච්" ශබ්දයෙන් මේඝය කියත්.*

එවං සුවාච් පයොමුච් ප්‍රභෘතයඃ

තකාරාන්ත පුංලිඞ්ග මහච්ඡබ්දඃ.

| ඒකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති C. |
|---|---|---|---|
| මහාන් | මහාන්තෞ | මහාන්තඃ | ප්‍ර—(ලි)—N. |
| [හෙ]මහන් | [හෙ]මහාන්තෞ | [හෙ]මහාන්තඃ | සම්—(ආ)—V. |
| මහාන්තම් | මහාන්තෞ | මහතඃ | ද්වි—(කා)—ACC. |
| මහතා | මහද්භ්‍යාම් | මහද්භිඃ | තෘ—(කා)—I. |
| මහතෙ | මහද්භ්‍යාම් | මහද්භ්‍යඃ | ච—(සං)—D. |
| මහතඃ | මහද්භ්‍යාම් | මහද්භ්‍යඃ | ප—(අ)—ABL. |
| මහතඃ | මහතොඃ | මහතාම් | ෂ—(සං)—G. |
| මහති | මහතොඃ | මහත්සු | ස—(ආ)—L. |

"මහත්" ශබ්දයෙන් මහතුන් කියත්.

තකාරාන්ත පුංලිඞ්ග ධීමච්ඡබ්දඃ.

| ඒකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| ධීමාන් | ධීමන්තෞ | ධීමන්තඃ | ප්‍ර—(ලි)—N. |
| (හෙ)ධීමන් | (හෙ)ධීමන්තෞ | (හෙ)ධීමන්තඃ | සම්—(ආ)—V. |
| ධීමන්තම් | ධීමන්තෞ | ධීමතඃ | ද්වි—(කා)—ACC. |

ශෙෂං මහච්ඡබ්දවත්.

"ධීමත්" ශබ්දයෙන් නුවණැත්තන් කියත්.

---

* සුවාච්, මනාවචන ඇත්තේ; පයොමුච්, මේඝය.

එවං ගොමත් ධනවත් ගුණවත් භවත් ප්‍රභෘතයඃ *

තකාරාන්ත පුංලිඞ්ගො පචච්ඡබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| පචන් | පචන්තෞ | පචන්තඃ | පු—[ලි]—N. |
| [හෙ]පචන් | [හෙ]පචන්තෞ | [හෙ]පචන්තඃ | සම්-[ආ]—V. |
| පචන්තම් | පචන්තෞ | පචතඃ | ද්වි—[කා]-ACC. |

ශෙෂං මහච්ඡබ්දවත්—

“පචත්” ශබ්දයෙන් පිසන්නාවූන් කියත්—

එවම් භවත් අදත් දීව්‍යත් ගච්ඡත් ප්‍රභෘතයඃ †

තකාරාන්ත පුංලිඞ්ගො දදච්ඡබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| දදත් | දදතෞ | දදතඃ | පු—[ලි]—N. |
| (හෙ)දදත් | (හෙ)දදතෞ | (හෙ)දදතඃ | සම්-[ආ]—V. |
| දදතම් | දදතෞ | දදතඃ | ද්වි—[කා]-ACC. |

ශෙෂං මහච්ඡබ්දවත්—

“දදත්” ශබ්දයෙන් දෙන්නාවූන් කියත්—

ඉන්ද්‍රජිද්භාෂ්‍යකාජ්ජක්ෂජ්ජාග්‍රච්ඡාශච්චකාශතඃ,

දධන්මරුද්බිභ්‍යදාදතඃ දදච්ඡබ්ද සමාමතාඃ ‡—

(පථ්‍යාවක්ත්‍රනාම්.)

---

* ගොමත්, ගෙරි ඇත්තේ; ධනවත්, ධනඇත්තේ; ගුණවත්, ගුණඇත්තේ; භවත්, තොප—

වර්තනාවූ මෙම “භවත්” ශබ්දයෙන් “තොප” හෙවත් “ඔත්වත්” යන අර්ථ කියත්—

† භවත්, වන්නේ; අදත්, අනුභවකරන්නේ; දීව්‍යත්, ක්‍රීඩා කරන්නේ; ගච්ඡත්, යන්නේ.—මෙහි “භවත්” ශබ්දය ‘ශතෘ’ ප්‍රත්‍යයාන්තයි—

‡ ඉන්ද්‍රජිත්, රාවණපුත්‍රයා; භාෂ්‍යකාත්, භාෂ්‍යකතෘය; ජක්ෂත්, අනුභව කරන්නේය; ජාග්‍රත්, නොනිදන්නේය; ශාසත්, අනුශාසනා කරන්නේය; චකාශතඃ, බබලන්නේය; දධත්, දරන්නේය; මරුත්, වාතය; බිභ්‍යත්, බියවන්නේය; ආදතඃ, [මේ] ආදි ශබ්දයෝ; දදත්ශබ්දසමාඃ, දදත්ශබ්දයහා සමානයෝයි; මතාඃ, දන්නා ලද්දානුය—

ශකාරාන්ත පුංලිඞ්ගො විශ්ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| විඩ්<br>විට් | } විශෞ | විශඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]විඩ්<br>[හෙ]විට් | } [හෙ]විශෞ | [හෙ]විශඃ | සම්-(ආ)-*V.* |
| විශම් | විශෞ | විශඃ | ද්වි—(කැ)-*ACC.* |
| විශා | විඩ්භ්‍යාම් | විඩ්භිඃ | තෘ-(කා)—*I.* |
| විශෙ | විඩ්භ්‍යාම් | විඩ්භ්‍යඃ | ච—(ස)—*D.* |
| විශඃ | විඩ්භ්‍යාම් | විඩ්භ්‍යඃ | ප—(ඇ)-*ABL.* |
| විශඃ | විශොඃ | විශාම් | ෂ—(ස)—*G.* |
| විශි | විශොඃ | විට්සු | ස—(ආ)—*L.* |

'විශ්' ශබ්දයෙන් වෛශ්‍යයන් කියත්—

එවම් භ්‍රශ් මෘශ් ප්‍රභෘතයඃ * —

අකාරාන්ත පුංලිඞ්ගො ධනමුෂශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| ධනමුඩ්<br>ධනමුට් | } ධනමුෂෞ | ධනමුෂඃ | ප්‍ර—(ලි)-*N.* |

ඉත්‍යාදි විශ්ශබ්දවත්—

"ධනමුෂ්" ශබ්දයෙන් වස්තු සොරුන් කියත්—

එවං විෂ්සිතත්විෂ් ප්‍රභෘතයඃ †—

සකාරාන්ත පුංලිඞ්ගො වෙධශ්ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| වෙධාඃ | වෙධසෞ | වෙධසඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]වෙධඃ | [හෙ]වෙධසෞ | [හො]වෙධසඃ | සම්-(ආ)—*V.* |
| වෙධසම් | වෙධසෞ | වෙධසඃ | ද්වි—(කා)-*ACC.* |
| වෙධසා | වෙධොභ්‍යාම් | වෙධොභිඃ | තෘ-(කා)—*I.* |
| වෙධසෙ | වෙධොභ්‍යාම් | වෙධොභ්‍යඃ | ච—(ස)—*D.* |
| වෙධසඃ | වෙධොභ්‍යාම් | වෙධොභ්‍යඃ | ප—(ඇ)-*ABL.* |
| වෙධසඃ | වෙධසොඃ | වෙධසාම් | ෂ—(ස)—*G.* |
| වෙධසි | වෙධසොඃ | වෙධස්සු | ස—(ආ)—*L.* |

---

* භ්‍රශ්, පතින වන්නේ; මෘශ්, ආමර්ශනය කරන්නේ.

†. විෂ්, ශත්‍රුයා; සිතත්විෂ්, චන්ද්‍රයා.

"වෙධස" ශබ්දයෙන් බ්‍රහ්මයා කීයත් —

එවං චන්ද්‍රමස් ප්‍රභෘතයඃ * —

සකාරාන්ත පුංලිඞ්ගො විද්වශ්ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| විද්වාන් | විද්වාංසෞ | විද්වාංසඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]විද්වන් | [හෙ]විද්වාංසෞ | [හෙ]විද්වාංසඃ | සම්-(ආ)—*V.* |
| විද්වාංසම් | විද්වාංසෞ | විදුෂඃ | ද්වි—(කා)-*ACC.* |
| විදුෂා | විද්වද්භ්‍යාම් | විද්වද්භිඃ | තෘ-(කා)—*I.* |
| විදුෂෙ | විද්වද්භ්‍යාම් | විද්වද්භ්‍යඃ | ච—(ස)—*D.* |
| විදුෂඃ | විද්වද්භ්‍යාම් | විද්වද්භ්‍යඃ | ප—(අ)-*ABL.* |
| විදුෂඃ | විදුෂොඃ | විදුෂාම් | ෂ—(ස)—*G.* |
| විදුෂි | විදුෂොඃ | විද්වත්සු | ස—(ආ)—*L.* |

"විද්වස්" ශබ්දයෙන් පණ්ඩිතයන් කියත් —

එවම් උපෙයිවස්, තස්ථිවස් ප්‍රභෘතයඃ † —

ඉති හලන්ත පුංලිඞ්ග සාමාන්‍ය ශබ්දඃ.

---

අථ හලන්ත පුංලිඞ්ග විශෙෂ ශබ්දඃ.

හකාරාන්ත පුංලිඞ්ගො විශ්වවාහ් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| විශ්වවාඩ් / විශ්වවාට් | විශ්වවාහෞ | විශ්වවාහඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]විශ්වවාඩ් / [හෙ]විශ්වවාට් | [හෙ]විශ්වවාහෞ | [හෙ]විශ්වවාහඃ | සම්-(ආ)—*V.* |
| විශ්වවාහම් | විශ්වවාහෞ | විශ්වෞහඃ | ද්වි—(කා)-*ACC.* |
| විශ්වෞහා | විශ්වවාඩ්භ්‍යාම් | විශ්වවාඩ්භිඃ | තෘ-(කා)--*I.* |
| විශ්වෞහෙ | විශ්වවාඩ්භ්‍යාම් | විශ්වවාඩ්භ්‍යඃ | ච—(ස)—*D.* |
| විශ්වෞහඃ | විශ්වවාඩ්භ්‍යාම් | විශ්වවාඩ්භ්‍යඃ | ප—(අ)-*ABL.* |

---

* චන්ද්‍රමස්, චන්ද්‍රයා.

† උපෙයිවස්, පැමුණුනෙන්; තස්ථිවස්, සිටිනෙන්.

| | | | |
|---|---|---|---|
| විශ්වවාහඃ | විශ්වවාහොඃ | විශ්වවාහාම් | ෂ--(ස)--G. |
| විශ්වවාහි | විශ්වවාහොඃ | විශ්වවාවිසු | ස—(අ)--L. |

"විශ්වවාහ්" ශබ්දයෙන් සියල්ල උසුලන්නේ යනඅර්ථකියත්.

එවං භාරවාහාදයඃ * ——

හකාරාන්ත පුංලිංගො 'නඩුහ් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| අනඩ්වාන් | අනඩ්වාහෞ | අනඩ්වාහඃ | ප්‍ර--(ලි)—N. |
| [හෙ]අනඩ්වන් | [හෙ]අනඩ්වාහෞ | [හෙ]අනඩ්වාහඃ | සම්-(අ)—V. |
| අනඩ්වාහම් | අනඩ්වාහෞ | අනඩුහඃ | ද්වි—(ක)-ACC. |
| අනඩුහා | අනඩුද්භ්‍යාම් | අනඩුද්භිඃ | තෘ-(ක)—I. |
| අනඩුහෙ | අනඩුද්භ්‍යාම් | අනඩුද්භ්‍යඃ | ච--(ස)—D. |
| අනඩුහඃ | අනඩුද්භ්‍යාම් | අනඩුද්භ්‍යඃ | ප--(අ)-ABL. |
| අනඩුහඃ | අනඩුහොඃ | අනඩුහාම් | ෂ—(ස)—G. |
| අනඩුහි | අනඩුහොඃ | අනඩුත්සු | ස--(අ)--L. |

"අනඩුහ්" ශබ්දයෙන් ගෙරින් කියත් ——

නකාරාන්ත පුංලිංගො වෘත්‍රහන් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| වෘත්‍රහා | වෘත්‍රහණෞ | වෘත්‍රහණඃ | ප්‍ර—(ලි)—N. |
| (හෙ)වෘත්‍රහන් | [හෙ]වෘත්‍රහණෞ | (හෙ)වෘත්‍රහණඃ | සම්-(අ)—V. |
| වෘත්‍රහණම් | වෘත්‍රහණෞ | වෘත්‍රඝ්නඃ † | ද්වි—(ක)-ACC. |
| වෘත්‍රඝ්නා | වෘත්‍රහභ්‍යාම් | වෘත්‍රහභිඃ | තෘ-(ක)—I. |
| වෘත්‍රඝ්නෙ | වෘත්‍රහභ්‍යාම් | වෘත්‍රහභ්‍යඃ | ච—(ස)--D. |
| වෘත්‍රඝ්නඃ | වෘත්‍රහභ්‍යාම් | වෘත්‍රහභ්‍යඃ | ප—(අ)-ABL. |
| වෘත්‍රඝ්නඃ | වෘත්‍රඝ්නොඃ | වෘත්‍රඝ්නාම් | ෂ—(ස)--G. |

* භාරවාහ්, බර උසුලන්නේ.

† පාණිනියෙහි "හන්තෙරත් පූර්වස්‍ය" යන්නෙන් 'හන' ධාතුව සම්බන්ධවූ අකාර පූර්ව නකාරයටම 'ණත්වය' දැක්වූ බැවින් "වෘත්‍රඝ්නඃ" යනාදී තන්හි 'ණත්ව' නොවේ—එසේද වූවත් ණත්ව හෙතුව පෙනෙන හෙයින් එහි විකල්ප වශයෙන් ණත්වයක් පාණිනීය වෘත්තිකාර මාධවාචාර්‍යයන් විසින් දක්වනලදී—එය භාෂ්‍යමතාදියටද සම්නොවේ ——

| | | | |
|---|---|---|---|
| වෘත්‍රඝ්නි<br>වෘත්‍රහණි } | වෘත්‍රඝ්නොඃ | වෘත්‍රහසු | ස— (ආ)—L. |

"වෘත්‍රහන්" ශබ්දයෙන් ශත්‍රුයා කියත්—

එවං බ්‍රහ්මහන් භ්‍රූණහන් ප්‍රභෘතයඃ *—

නකාරාන්ත පුංලිඞ්ගො 'ආයුෂ්මත් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ආයුෂ්මා | ආයුෂ්මන්තෞ | ආයුෂ්මන්තඃ | ප්‍ර—(ලි)—N. |
| හෙ]ආයුෂ්මත් | හෙ]ආයුෂ්මන්තෞ | (හෙ)ආයුෂ්මන්තඃ | සම්-(ආ)—V. |
| ආයුෂ්මන්තම් | ආයුෂ්මන්තෞ | ආයුෂ්මතඃ | ද්වි—(ක)-ACC. |
| ආයුෂ්මතා | ආයුෂ්මද්භ්‍යාම් | ආයුෂ්මද්භිඃ | තෘ-(ක)—I. |
| ආයුෂ්මතෙ | ආයුෂ්මද්භ්‍යාම් | ආයුෂ්මද්භ්‍යඃ | ච—(ස)—D. |
| ආයුෂ්මතඃ | ආයුෂ්මද්භ්‍යාම් | ආයුෂ්මද්භ්‍යඃ | ප—(අ)-ABL. |
| ආයුෂ්මතඃ | ආයුෂ්මතොඃ | ආයුෂ්මතාම් | ෂ—(ස)—G. |
| ආයුෂ්මති<br>ආයුෂ්මති } | ආයුෂ්මතොඃ | ආයුෂ්මත්සු | ස— (ආ)—L. |

"ආයුෂ්මත්" ශබ්දයෙන් [illegible] කියත්—

එවම් † පූෂන් ශබ්දඃ ‡ —

* බ්‍රහ්මහන්, බමුණන් නසන්නේ; භ්‍රූණහන්, දරුගැබ් නසන්නේ—

† පාණිනි ව්‍යාකරණ ක්‍රමයෙන් "පූෂන්" ශබ්දයාගේද සප්තමී එකවචනයෙහි "පූෂ්ණි-පූෂණි" කියා රූපද්වයක්වේ—

සාරස්වත මුග්ධබෝධාදියෙහි "පූෂි-පූෂ්ණි-පූෂණි" කියා රූප තුනක් කියත්—

‡ පූෂන් ශබ්දඃ, (සූර්‍ය්‍යපර්‍ය්‍යායවූ) පූෂන් ශබ්දය; එවම්, මෙසේයි—

නකාරාන්ත පුංලිඞ්ගඃ මඝවන් ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| මඝවා * | මඝවානෞ | මඝවානඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)මඝවන් | (හෙ)මඝවානෞ | (හෙ)මඝවානඃ | සම්—(ආ)—*V.* |
| මඝවානම් | මඝවානෞ | මඝොනඃ | ද්වි—(ක)—*ACC.* |
| මඝොනා | මඝවභ්‍යාම් | මඝවභිඃ | තෘ—(ක)—*I.* |
| මඝොනෙ | මඝවභ්‍යාම් | මඝවභ්‍යඃ | ච—(ස)—*D.* |
| මඝොනඃ | මඝවභ්‍යාම් | මඝවභ්‍යඃ | ප—(අ)—*ABL.* |
| මඝොනඃ | මඝොනොඃ | මඝොනාම් | ෂ—(ස)—*G.* |
| මඝොනි | මඝොනොඃ | මඝවසු | ස—(ආ)—*L.* |

"මඝවන්" ශබ්දයෙන් ශක්‍රයා කියත්—

නකාරාන්ත පුංලිඞ්ගඃ ශ්වන් ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ශ්වා | ශ්වානෞ | ශ්වානඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)ශ්වන් | (හෙ)ශ්වානෞ | (හෙ)ශ්වානඃ | සම්—(ආ)—*V.* |
| ශ්වානම් | ශ්වානෞ | ශුනඃ | ද්වි—(ක)—*ACC.* |
| ශුනා | ශ්වභ්‍යාම් | ශ්වභිඃ | තෘ—(ක)—*I.* |
| ශුනෙ | ශ්වභ්‍යාම් | ශ්වභ්‍යඃ | ච—(ස)—*D.* |
| ශුනඃ | ශ්වභ්‍යාම් | ශ්වභ්‍යඃ | ප—(අ)—*ABL.* |
| ශුනඃ | ශුනොඃ | ශුනාම් | ෂ—(ස)—*G.* |
| ශුනි | ශුනොඃ | ශ්වසු | ස—(ආ)—*L.* |

"ශ්වන්" ශබ්දයෙන් ශුනකයන් කියත්—

---

* පාණිනියෙහි "මඝවාබහුලම්" යන්නෙන් 'මඝවන්' ශබ්දයාගේ අන්තයට—'තෘාදෙශ' කොට "මඝවාන්—මඝවන්තෞ" යනාදිය සිද්ධකටයුතු බව දක්වනලදී—වාර්තික මතය ලෙස "මතුප්" ප්‍රත්‍යයෙන්ද 'මඝවත්' ශබ්දය සිද්ධවේ—එසේ සිද්ධවූ කල්හි "ධීමත්" ශබ්දයමෙන් වරනැගිය යුතුවේ—එබව රඝුවංශයෙහි "සකිල සංයුග මූර්ධනි සහායතාං මඝවතඃ ප්‍රතිපද්‍ය මහාරථඃ" යන්නෙන්ද, භට්ටිකාව්‍යයෙහි "ගර්විජ්ෂිතිනිඃ ශඞ්කා මඝොනු මඝවානසෞ" යනාදියෙන්ද පෙනේ—

නකාරාන්ත පුංලිඞ්ගෝ යුවන් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| යුවා | යුවානො | යුවානඃ | ප්‍ර--(ලි)--*N.* |
| [හෙ]යුවන් | [හෙ]යුවානො | [හෙ]යුවානඃ | සම්-(ආ)-*V.* |
| යුවානම් | යුවානො | යූනඃ | ද්වි—(ක)-*ACC.* |
| යූනා | යුවභ්‍යාම් | යුවභිඃ | තෘ-(ක)--*I.* |
| යූනෙ | යුවභ්‍යාම් | යුවභ්‍යඃ | ච—(ස)--*D.* |
| යූනඃ | යුවභ්‍යාම් | යුවභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| යූනඃ | යූනොඃ | යූනාම් | ෂ—(ස)--*G.* |
| යූනි | යූනොඃ | යුවසු | ස--(ආ)--*L.* |

"යුවන්" ශබ්දයෙන් තරුණයන් කියත්—

නකාරාන්ත පුංලිඞ්ගෝ 'ර්වන්'ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| අර්වා | අර්වාණො | අර්වාණඃ | ප්‍ර—(ලි)—*N.* |

ශෙෂං ධීමවත්—

"අර්වන්" ශබ්දයෙන් අශ්වයන් කියත්—

නකාරාන්ත පුංලිඞ්ගඃ පථින් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| පන්ථාඃ | පන්ථානො | පන්ථානඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]පන්ථාඃ | [හෙ]පන්ථානො | [හෙ]පන්ථානඃ | සම්-(ආ)—*V.* |
| පන්ථානම් | පන්ථානො | පථඃ | ද්වි—(ක)-*ACC.* |
| පථා | පථිභ්‍යාම් | පථිභිඃ | තෘ-(ක)—*I.* |
| පථෙ | පථිභ්‍යාම් | පථිභ්‍යඃ | ච—(ස)--*D.* |
| පථඃ | පථිභ්‍යාම් | පථිභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| පථඃ | පථොඃ | පථාම් | ෂ--(ස)--*G.* |
| පථි | පථොඃ | පථිෂු | ස—(ආ)—*L.* |

"පථින්" ශබ්දයෙන් මාර්ගය කියත්—

එවම් මන්ථාඃ *

---

* මන්ථාඃ, [මන්ථනදණ්ඩපර්‍ය්‍යායවූ] මථින් ශබ්දය; එවම්, මෙසේමැයි—

ජකාරාන්ත පුංලිඞ්ගො යුජ් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
| --- | --- | --- | --- |
| *S.* | *D.* | *P.* | *C.* |
| යුඞ් * | යුඤ්ජෞ | යුඤ්ජඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)යුඞ් | (හෙ)යුඤ්ජෞ | (හෙ)යුඤ්ජඃ | සම්-(ආ)—*V.* |
| යුඤ්ජම් | යුඤ්ජෞ | යුජඃ | ද්වි—(ක)-*ACC.* |

ශෙෂං භිෂජ් ශබ්දවත්—

“යුජ්” ශබ්දයෙන් යොගීන් කියත්—

ජකාරාන්ත පුංලිඞ්ගො රාජ් ශබ්දඃ.

| | | | |
| --- | --- | --- | --- |
| රාට් / රාඩ් | රාජෞ | රාජඃ | ප්‍ර—(ලි)—*N.* |
| [හෙ]රාට් / [හෙ]රාඩ් | [හෙ]රාජෞ | [හෙ]රාජඃ | සම්-(ආ)—*V* |
| රාජම් | රාජෞ | රාජඃ | ද්වි--(ක)-*ACC.* |
| රාජා | රාඩ්භ්‍යාම් | රාඩ්භිඃ | තෘ-(ක)—*I.* |
| රාජෙ | රාඩ්භ්‍යාම් | රාඩ්භ්‍යඃ | ච—(ස)—*D.* |
| රාජඃ | රාඩ්භ්‍යාම් | රාඩ්භ්‍යඃ | ප—(අ)-*ABL.* |
| රාජඃ | රාජොඃ | රාජාම් | ෂ—(ස)—*G.* |
| රාජි | රාජොඃ | රාට්සු / රාට්ත්සු | ස—(ආ)—*L.* |

“රාජ්” ශබ්දයෙන් රජුන් කියත්—

එවං විශ්වසෘජ් පරිමෘජ් විභ්‍රාජ් † පරිව්‍රාජ් ඉත්‍යාදයඃ ‡—

චකාරාන්ත පුංලිඞ්ගඃ ප්‍රාච් ශබ්දඃ.

| | | | |
| --- | --- | --- | --- |
| ප්‍රාඞ් | ප්‍රාඤ්චෞ | ප්‍රාඤ්චඃ | ප්‍ර—(ලි)—*N.* |

---

* මෙය රුධාදි ගණයට ඇතුළත් “යුජ-යුතෞ” යන ධාතුවෙන් සිද්ධයි,—දෛවාදිකවූ “යුජ-සමාධෞ” යන ධාතුවෙන් සිද්ධවූ “යුජ්” ශබ්දය භිෂජ් ශබ්දයමෙන් වරනැගිය යුතුවේ—

† විභ්‍රාජ් ශබ්දය (පක්ෂයෙක්හි) භිෂජ් ශබ්දය මෙනි.

‡ විශ්වසෘජ්, බ්‍රහ්මයා; පරිමෘජ්, පිරිසිදු කරන්නේය; විභ්‍රාජ්, බබලන්නේය; පරිව්‍රාජ්, එනම් යතීන්ද්‍රය හෙවත් සන්‍යාසීන්ද්‍රය.

| | | | |
|---|---|---|---|
| ප්‍රාඤ්චම් | ප්‍රාඤ්චෞ | ප්‍රාචඃ * | ද්වි—(ක)—ACC. |
| ප්‍රාචා | ප්‍රාග්භ්‍යාම් | ප්‍රාග්භිඃ | තෘ—(ක)—I. |

ශෙෂා ජලමුච්ඡබ්දවත්—

"ප්‍රාච්" ශබ්දයෙන් පූර්වකාලය කියත්—

චකාරාන්ත පුංලිඞ්ගඃ සධ්‍ර්‍යඤ්ච් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| සධ්‍ර්‍යඞ් | සධ්‍ර්‍යඤ්චෞ | සධ්‍ර්‍යඤ්චඃ | ප්‍ර—(ලි)—N. |
| සධ්‍ර්‍යඤ්චම් | සධ්‍ර්‍යඤ්චෞ | සධ්‍ර්‍යඤ්චඃ | ද්වි—(ක)—ACC. |
| සධ්‍රීචා | සධ්‍ර්‍යග්භ්‍යාම් | සධ්‍ර්‍යග්භිඃ | තෘ—(ක)—I. |
| සධ්‍රීචෙ | සධ්‍ර්‍යග්භ්‍යාම් | සධ්‍ර්‍යග්භ්‍යඃ | ච—(ස)—D. |
| සධ්‍රීචඃ | සධ්‍ර්‍යග්භ්‍යාම් | සධ්‍ර්‍යග්භ්‍යඃ | ප—(අ)—ABL. |
| සධ්‍රීචඃ | සධ්‍රීචොඃ | සධ්‍රීචාම් | ෂ—(ස)—G. |
| සධ්‍රීචි | සධ්‍රීචොඃ | සධ්‍ර්‍යක්ෂු | ස—(ආ)—L. |

"සධ්‍ර්‍යඤ්ච්" ශබ්දයෙන් සමග හැසිරෙන්නවුන් කියත්—

එවං සම්‍යඤ්ච් ප්‍රත්‍යඤ්ච් ප්‍රභෘතයඃ †—

චකාරාන්ත පුංලිඞ්ග තිර්‍යඤ්ච් ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| තිර්‍යඞ් | තිර්‍යඤ්චෞ | තිර්‍යඤ්චඃ | ප්‍ර—(ලි)—N. |

---

* "නාඤ්චෙඃ පූජායාම්" යන පාණිනි වචනයෙහින් පූජාර්ථ වූ අඤ්චුධාතුව අනන්තවූකල්හි උපධා ලොපය නොවේ—එවිට "අචඃ" යන සූත්‍රයෙහි අනුවෘත්තවූ අකාර ලොපයද නොවන බැවින් ද්විතීයාව පටන් රූපක්‍රමය මෙසේ දතයුතුයි.

| | | | |
|---|---|---|---|
| ප්‍රාඤ්චම් | ප්‍රාඤ්චෞ | ප්‍රාඤ්චඃ | ද්වි—(ක)—ACC. |
| ප්‍රාඤ්චා | ප්‍රාඞ්භ්‍යාම් | ප්‍රාඞ්භිඃ | තෘ—(ක)—I. |
| ප්‍රාඤ්චෙ | ප්‍රාඞ්භ්‍යාම් | ප්‍රාඞ්භ්‍යඃ | ච—(ස)—D. |
| ප්‍රාඤ්චඃ | ප්‍රාඞ්භ්‍යාම් | ප්‍රාඞ්භ්‍යඃ | ප—(අ)—ABL. |
| ප්‍රාඤ්චඃ | ප්‍රාඤ්චොඃ | ප්‍රාඤ්චාම් | ෂ—(ස)—G. |
| ප්‍රාඤ්චි | ප්‍රාඤ්චොඃ | {ප්‍රාඞ්ක්ෂු / ප්‍රාඞ්ෂු} | ස—(ආ)—L. |

පූජාර්ථක අඤ්චුධාත්වන්තවූ සෙසුතන්හිද මෙසේමැයි.

† සම්‍යඤ්ච්, යහපත; ප්‍රත්‍යඤ්ච්, පශ්චිම කාලය.

| | | | |
|---|---|---|---|
| නියඞ්ක්ෂුවම් | නියඞ්ෂෞ | නිරශ්වඃ | ඞි—(ක)-ACC. |
| නිරශ්වා | නියඞ්ගභ්‍යාම් | නියඞ්ගභිඃ | තෘ-(ක)—I. |

ඉත්‍යාදි—

"නියඞ්ච්" ශබ්දයෙන් නිරශ්විනයන් කියත්—

ශකාරාන්ත පුංලිඞ්ගස්තාදෘශශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| තාදෘග් } තාදෘක් } | තාදෘශෞ | තාදෘශඃ | ප්‍ර— (ලි)—N. |
| තාදෘශම් | තාදෘශෞ | තාදෘශඃ | ඞි— (ක)-ACC. |
| තාදෘශා | තාදෘගභ්‍යාම් | තාදෘගභිඃ | තෘ- (ක)--I. |

ඉත්‍යාදි—

"තාදෘශ්" ශබ්දයෙන් එබඳුය යන අර්ථ කියත්—

එවම් අන්‍යාදෘශ් යාදෘශ් භවාදෘශ් ප්‍රභෘතයඃ * —

සකාරාන්ත පුංලිඞ්ගඃ පුම්ස් ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| පුමාන් | පුමාංසෞ | පුමාංසඃ | ප්‍ර—(ලි)--N. |
| (හෙ)පුමන් | (හෙ)පුමාංසෞ | (හෙ)පුමාංසඃ | සම්-(ආ)--V. |
| පුමාංසම් | පුමාංසෞ | පුංසඃ | ඞි-- (ක)-ACC. |
| පුංසා | පුම්භ්‍යාම් | පුම්භිඃ | තෘ- (ක)—I. |
| පුංසෙ | පුම්භ්‍යාම් | පුම්භ්‍යඃ | ච— (ස)--G. |
| පුංසඃ | පුම්භ්‍යාම් | පුම්භ්‍යඃ | ප— (අ)-ABL. |
| පුංසඃ | පුංසොඃ | පුංසාම් | ෂ— (ස)--G. |
| පුංසි | පුංසොඃ | පුංසු | ස— (ආ)--L. |

"පුම්ස්"ශබ්දයෙන් පුරුෂයන් කියත්—

සකාරාන්ත පුංලිඞ්ග උශනශ්ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| උශනා | උශනසෞ | උශනසඃ | ප්‍ර--(ලි)—N. |
| [හෙ]උශන } [හෙ]උශනන් } (හෙ)උශනඃ } | [හෙ]උශනසෞ | [හෙ]උශනසඃ | සම්-(ආ)—V. |

ශෙෂං වෙධශශබ්දවත්—

---

* අන්‍යාදෘශ්, අන්බඳුය; යාදෘශ්, යම්බඳුය; භවාදෘශ්, තොප බඳුය.

“උශනස්”ශබ්දයෙන් ශුක්‍ර ග්‍රහයා කියත්—

ඉති හලන්ත පුංලිඞ්ග විශෙෂශබ්දාඃ.

---

## අථාජන්ත ස්ත්‍රීලිඞ්ග සාමාන්‍ය ශබ්දාඃ—

### ආකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො ලතා ශබ්දඃ.

| ඒකවචන. *S.* | ද්විවචන. *D.* | බහුවචන. *P.* | විභක්ති. *C.* |
|---|---|---|---|
| ලතා | ලතෙ | ලතාඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)ලතෙ | (හෙ)ලතෙ | (හෙ)ලතාඃ | සම්-(ආ)—*V.* |
| ලතාම් | ලතෙ | ලතාඃ | ද්වි—(ක)-*ACC* |
| ලතයා | ලතාභ්‍යාම් | ලතාභිඃ | තෘ-(ක)—*I.* |
| ලතායෛ | ලතාභ්‍යාම් | ලතාභ්‍යඃ | ච--(ස)-*D.* |
| ලතායාඃ | ලතාභ්‍යාම් | ලතාභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| ලතායාඃ | ලතයොඃ | ලතානාම් | ෂ—(ස)—*G.* |
| ලතායාම් | ලතයොඃ | ලතාසු | ස—(අ)—*L.* |

“ලතා”ශබ්දයෙන් ලිය කියත්—

ඒවං රාමා රමා භාමා වනිතා විනතා ‘මාතාඃ,
විශාලා සපතලා මාලා ශිලා ශාලා කලාදයඃ *

### ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො මති ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| මතිඃ | මතී | මතයඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)මතෙ | (හෙ)මතී | (හෙ)මතයඃ | සම්-(ආ)—*V.* |
| මතිම් | මතී | මතීඃ | ද්වි—(ක)-*ACC.* |
| මත්‍යා | මතිභ්‍යාම් | මතිභිඃ | තෘ-(ක)—*I.* |
| මත්‍යෛ / මතයෙ | මතිභ්‍යාම් | මතිභ්‍යඃ | ච—(ස)—*D* |

---

* රාමා, ගීතාදි කලායෙහි දක්ෂ ස්ත්‍රිය; රමා, ශ්‍රීකාන්තාවය; භාමා, කිපෙනසුලු ස්ත්‍රිය; වනිතා, ස්ත්‍රිය; විනතා, ගරුඬමාතෘවය; අමාතාඃ, අරලුය; විශාලා, තියඹරාය; සපතලා, සිනිද්දය; මාලා, මල්මාලාවය; ශිලා, පාෂාණය; ශාලා, ගෘහය; කලා, (ගීත වාද්‍යාදි සිව්සැට) කලා ශිල්පය (යනු) ආදයඃ, මේ ආදි ශබ්දයෝ; එවම්, මෙසේමැයි—

| | | | |
|---|---|---|---|
| මත්‍යාඃ<br>මතේඃ | මතිභ්‍යාම් | මතිභ්‍යඃ | ප— (අ)-*ABL.* |
| මත්‍යාඃ<br>මතේඃ | මත්‍යෝඃ | මතීනාම් | ෂ— (ස)—*G.* |
| මත්‍යාම්<br>මතෞ | මත්‍යෝඃ | මතිෂු | ස— (අා)—*L.* |

"මති"ශබ්දයෙන් ප්‍රඥාව කියත්—

[තොටක-නම්.]

ශ්‍රැති ජාති ධෘති ස්තුති භීති රුචි
ප්‍රතිපත්ති විභක්ති නුති ස්මෘතයඃ,
ගති බුද්ධි විභූති විපත්ති මිති.
ද්‍යුති රීති රතිප්‍රමුඛා මතිවත් * —

ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො නදී ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| නදී | නද්‍යෞ | නද්‍යඃ | ප්‍ර— (ලි)—*N.* |
| (හෙ)නදි | (හෙ)නද්‍යෞ | (හෙ)නද්‍යඃ | සම්-(අා)—*V.* |
| නදීම් | නද්‍යෞ | නද්‍යඃ | ද්වි— (ක)-*ACC.* |
| නද්‍යා | නදීභ්‍යාම් | නදීභිඃ | තෘ-(ක)--*I.* |
| නද්‍යෛ | නදීභ්‍යාම් | නදීභ්‍යඃ | ච— (ස)--*D.* |
| නද්‍යාඃ | නදීභ්‍යාම් | නදීභ්‍යඃ | ප— (අ)-*ABL.* |
| නද්‍යාඃ | නද්‍යෝඃ | නදීනාම් | ෂ-- (ස)—*G.* |
| නද්‍යාම් | නද්‍යෝඃ | නදීෂු | ස—(අා)—*L.* |

"නදී"ශබ්දයෙන් ගං ගෙහෝ කියත්—

---

* ශ්‍රැති, වෙදය; ජාති, උත්පත්තිය; ධෘති, ධාරණය; ස්තුති, ස්තොත්‍රය; භීති, භයය; රුචි, රශ්මිය; ප්‍රතිපත්ති, පිළිපැදීමය; විභක්ති, විභාගය; නුති, ස්තුතිය; ස්මෘතයඃ, සිහිය; ගති, ගමනය; බුද්ධි, ඥානය; විභූති, ඓශ්වර්ය්‍යය; විපත්ති, විපතය; මිති, ප්‍රමාණය; ද්‍යුති, ශොභාවය; රීති, ස්වභාවය; රතිප්‍රමුඛාඃ, රාගය (යනමේ ශබ්දයන්) ආදිකොට ඇත්තාහු; මතිවත්, මති ශබ්දය මෙනි—

[ශාලිනී-නම්.]

එවං වාණී භාමිනී දෛව වාණී
ගෞරී නාරී ඊශ්වරී සර්වරීච,
උර්වී ගුර්වී පාර්වතී චෛත්‍රවත්‍යෞ
නීලී කාලී කාලමේෂ්‍යා දයොපි * —

උකාරාන්ත ස්ත්‍රීලිඞ්ගෝ ධේනු ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| ධේනුඃ | ධේනූ | ධේනවඃ | ප්‍ර— (ලි)—N. |
| [හෙ]ධේනො | [හෙ]ධේනූ | [හෙ]ධේනවඃ | සම්-(ආ)—V. |
| ධේනුම් | ධේනූ | ධේනූඃ | ද්වි— (ක)—ACC. |
| ධේන්වා | ධේනුභ්‍යාම් | ධේනුභිඃ. | තෘ- (ක)—I. |
| ධේන්වෛ<br>ධේනවෙ | ධේනුභ්‍යාම් | ධේනුභ්‍යඃ | ච—(ස)—D. |
| ධේන්වාඃ<br>ධේනොඃ | ධේනුභ්‍යාම් | ධේනුභ්‍යඃ | ප—(අ)—ABL. |
| ධේන්වාඃ<br>ධේනොඃ | ධේන්වොඃ | ධේනූනාම් | ෂ—(ස)—G. |
| ධේන්වාම්<br>ධේනෞ | ධේන්වොඃ | ධේනුෂු | ස—(ආ)—L. |

"ධේනු"ශබ්දයෙන් අලුත වැදූ දෙන් කියත් —

එවං තනු සින්ධු කරෙණු ප්‍රභෘතයඃ † —

ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ගෝ වධූ ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| වධූඃ | වධ්වෞ | වධ්වඃ | ප්‍ර-- (ලි)—N. |
| (හෙ)වධූ | (හෙ)වධ්වෞ | (හෙ)වධ්වඃ | සම්-(ආ)—V. |
| වධූම් | වධ්වෞ | වධූඃ | ද්වි-- (ක)-ACC. |

* වාණී, සරස්වතිය; භාමිනී, කිපෙනසුලු ස්ත්‍රිය; දෛව වාණී, සංස්කෘත භාෂාවය; ගෞරී, උමාදෙවිය; නාරී, ස්ත්‍රිය; ඊශ්වරී, සතාවාරිය, සර්වරීච, රාත්‍රියද; උර්වී, පෘථිවිය; ගුර්වී ගර්භිණීය; පාර්වතී, උමාදෙවිය; චෛත්‍රවත්‍යෞ, චෛත්‍රවතීනම් ගඞ්ගාවය; නීලී; අවරිය; කාලී; ඇත්සැටිය; කාලමේෂී, වැල්මදටය [යනු;] ආදයඃඅපි, [මේ] ආදිශබ්දයොද; එවම්, මෙසේමැයි —

† තනු, ශරීරය; සින්ධු, ගඞ්ගාවය; කරෙණු, ගැසනිනිය.

| | | | |
|---|---|---|---|
| වධ්වා | වධූභ්‍යාම් | වධූභිඃ | තෘ-(ක)—I. |
| වධ්වෛ | වධූභ්‍යාම් | වධූභ්‍යඃ | ච--(ස)—D. |
| වධ්වාඃ | වධූභ්‍යාම් | වධූභ්‍යඃ | පං--(අ)-ABL. |
| වධ්වාඃ | වධ්වොඃ | වධූනාම් | ෂ--(ස)--G. |
| වධ්වාම් | වධ්වොඃ | වධූෂු | ස—(ආ)—L. |

"වධූ"ශබ්දයෙන් ස්ත්‍රීන් කියත්

එවං තනූ චමූ ප්‍රභෘතයඃ *

ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො මාතෘ ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| මාතා | මාතරෞ | මාතරඃ | ප්‍ර—(ලි)—N. |
| [හෙ]මාතඃ | [හෙ]මාතරෞ | [හෙ]මාතරඃ | සම්-(ආ)—V. |
| මාතරම් | මාතරෞ | මාතහඃ | ද්වි—(ක)-ACC. |

ශෙෂං ධාතෘ ශබ්දවත්

"මාතෘ"ශබ්දයෙන් මව කියත්

එවං දුහිතෘ යාතෘ නනාන්දෘ ප්‍රභෘතයඃ †

ඉත්‍යෘදන්ත ස්ත්‍රීලිඞ්ග සාමාන්‍ය ශබ්දාඃ.

---

අථාජන්ත ස්ත්‍රීලිඞ්ග විශෙෂ ශබ්දාඃ

ද්විතීයා ශබ්දො ලතා ශබ්දවත්

චතුර්ථී විභක්ති මාරභ්‍ය විශෙෂඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| ද්විතීයස්‍යෛ<br>ද්විතීයායෛ | ද්විතීයාභ්‍යාම් | ද්විතීයාභ්‍යඃ | ච—(ස)—D. |
| ද්විතීයස්‍යාඃ<br>ද්විතීයායාඃ | ද්විතීයාභ්‍යාම් | ද්විතීයාභ්‍යඃ | පං—(අ)-ABL. |
| ද්විතීයස්‍යාඃ<br>ද්විතීයායාඃ | ද්විතීයයොඃ | ද්විතීයානාම් | ෂ—(ස)--G. |

---

* තනූ, ශරීරය; චමූ, සෙනාවය.

† දුහිතෘ, දූය; යාතෘ, යාතාවය; නනාන්දෘ, නෑනාය.

ස්වාමියාගේ සහොදරවූ හැමදනාගේ භාර්‍ය්‍යාවෝ ඔවූ නොවූත්ව; "යාතෘ"නම් වන්නාහ

| | | | |
|---|---|---|---|
| විනීයසහාම් විනිඝාඝාම් | විනියයොඃ | විනියාසු | ස--(ආ)--*L*. |

එවනාතෘනියා

අම්බා ශබ්දෙ, * ලතා ශබ්දවත් සම්බුද්ධාවෙවභෙදඃ.

(හෙ)අම්බ (හෙ)අම්බෙ (හෙ)අම්බාඃ සම්-(ආ)-*V*.

විශ්වපාදයසතු පුංවත්.

ඊකාරාන්ත ස්ත්‍රිලිඞ්ගා ලක්‍ෂ්මී ශබ්දඃ.

ලක්‍ෂ්මීඃ ලක්‍ෂ්ම්‍යෞ ලක්‍ෂ්ම්‍යඃ පු—(ලි)—*N*.

ශෙෂං නදී ශබ්දවත්

"ලක්‍ෂ්මී"ශබ්දයෙන් ශ්‍රිකාන්තාව කියත්

එවං තරී තන්ත්‍රාදයඃ †

ඊකාරාන්ත ස්ත්‍රිලිඞ්ගඃ ස්ත්‍රිශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S*. | *D*. | *P*. | *C*. |
| ස්ත්‍රී | ස්ත්‍රියෞ | ස්ත්‍රියඃ | පු— (ලි)—*N*. |
| [හෙ]ස්ත්‍රි | [හෙ]ස්ත්‍රියෞ | [හෙ]ස්ත්‍රියඃ | සම්-(ආ)—*V*. |
| ස්ත්‍රියම් ස්ත්‍රීම් | ස්ත්‍රියෞ | ස්ත්‍රියඃ ස්ත්‍රීඃ | ඞි— (ක)-*ACC*. |
| ස්ත්‍රියා | ස්ත්‍රීභ්‍යාම් | ස්ත්‍රීභිඃ | තා- (ක)—*I*. |
| ස්ත්‍රියෛ | ස්ත්‍රීභ්‍යාම් | ස්ත්‍රීභ්‍යඃ | ච— (ස)—*D*. |
| ස්ත්‍රියාඃ | ස්ත්‍රීභ්‍යාම් | ස්ත්‍රීභ්‍යඃ | ප— (අ)-*ABL*. |
| ස්ත්‍රියාඃ | ස්ත්‍රියොඃ | ස්ත්‍රීණාම් | ඡ—(ස)—*G*. |
| ස්ත්‍රියාම් | ස්ත්‍රියොඃ | ස්ත්‍රීෂු | ස—(ආ)—*L*. |

"ස්ත්‍රී"ශබ්දයෙන් අඟනන් කියත්

ඊකාරාන්ත ස්ත්‍රිලිඞ්ගඃ ශ්‍රීශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| ශ්‍රීඃ | ශ්‍රියෞ | ශ්‍රියඃ | පු--(ලි)--*N*. |
| (හෙ)ශ්‍රීඃ | (හෙ)ශ්‍රියෞ | (හෙ)ශ්‍රියඃ | සම්-(ආ)—*V*. |
| ශ්‍රියම් | ශ්‍රියෞ | ශ්‍රියඃ | ඞි—(ක)-*ACC*. |
| ශ්‍රියා | ශ්‍රීභ්‍යාම් | ශ්‍රීභිඃ | තා-(ක)—*I*. |

* අම්බා ශබ්දය මාතෘවාචකයි.

† තරී, නෞකාවය, තන්ත්‍රි, තතය.

| | | | |
|---|---|---|---|
| ශ්‍රියෛ / ශ්‍රියෙ | ශ්‍රීභ්‍යාම් | ශ්‍රීභ්‍යඃ | ච--(ස)-*D.* |
| ශ්‍රියාඃ / ශ්‍රියඃ | ශ්‍රීභ්‍යාම් | ශ්‍රීභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| ශ්‍රියාඃ / ශ්‍රියඃ | ශ්‍රියොඃ | ශ්‍රීණාම් / ශ්‍රියාම් | ෂ—(ස)—*G.* |
| ශ්‍රියාම් / ශ්‍රියි | ශ්‍රියොඃ | ශ්‍රීෂු | ස--(ආ)—*L.* |

"ශ්‍රී"ශබ්දයෙන් ශ්‍රීකාන්තාව කියත් —

එවං ධී හ්‍රී භී ප්‍රභෘතයඃ * —

සුධීඃ ශ්‍රීව දෙව--සෙනානී ශබ්දස්තු පුංවත් —

ඌකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො භ්‍රූ ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| භ්‍රූඃ | භ්‍රුවෞ | භ්‍රුවඃ | ප්‍ර—(ලි)—*N.* |

ඉත්‍යාදි-ශ්‍රී ශබ්දවත් —

"භ්‍රූ"ශබ්දයෙන් බැම කියත් —

එවම්භූසුභ්‍රූප්‍රභෘතයඃ † —

සුභ්‍රූ ශබ්දස්‍ය සම්බුද්ධෞ හ්‍රස්ව එව විශෙෂඃ.

| | | | |
|---|---|---|---|
| [හෙ]සුභ්‍රු ‡ | [හෙ]සුභ්‍රුවෞ | [හෙ]සුභ්‍රුවඃ | සම්-(ආ)—*V.* |

ඍකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ ස්වසෘ ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| ස්වසා | ස්වසාරෞ | ස්වසාරඃ | ප්‍ර--(ලි)--*N.* |
| [හෙ]ස්වසඃ | [හෙ]ස්වසාරෞ | [හෙ]ස්වසාරඃ | සම්-(ආ)—*V.* |
| ස්වසාරම් | ස්වසාරෞ | ස්වසෘඃ | ද්වි—(ක)-*ACC.* |

ශෙෂං මාතෘ ශබ්දවත් —

"ස්වසෘ" ශබ්දයෙන් නැගනියන් කියත් —

ද්‍යො ශබ්දො, ගොවත්-නෞ ශබ්දො, ග්ලෞවත් —

ඉත්‍යජන්ත ස්ත්‍රීලිඞ්ග විශෙෂ ශබ්දාඃ.

---

* ධී, ප්‍රඥාව; හ්‍රී, ලජ්ජාව; භී, භය.

† භූ, පෘථිවිය; සුභ්‍රූ, මනා බැම ඇත්තිය.

‡ පාණිනියෙහි "නෙයඞුවඞ් ස්ථානාවස්ත්‍රී" යන සූත්‍රයෙන් 'නදී' සංඥාව නිෂිද්ධ හෙයින් 'සුභ්‍රූ' ශබ්දයාගේ සම්බොධනෛක වචනයෙහි හ්‍රස්ව නොවන නමුත් මුග්ධබොධ ව්‍යාකරණාදියෙහිද, කාව්‍යසමයෙහිද, හ්‍රස්ව රූපය දක්නා ලැබේ.

අථ හලනන සත්‍රීලිඞ්ග සාමාන්‍ය ශබ්දාඃ—
හකාරාන්තා මධුලිහාදයඃ පුංවත්—
රෙඵාන්ත ස්ත්‍රීලිඞ්ගො ගිර් ශබ්දඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ගීඃ | ගිරෞ | ගිරඃ | ප්‍ර—(ලි)—*N.* |
| ගිරම් | ගිරෞ | ගිරඃ | ද්වි—(ක)-*ACC.* |
| ගිරා | ගීර්භ්‍යාම් | ගීර්භිඃ (ඉත්‍යාදී) | තෘ-(ක)—*I.* |

"ගිර්"ශබ්දයෙන් සරස්වතිය කියත්—

එවං පූර් ධූර් ප්‍රභෘතයඃ * —

භකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ කකුභ් ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| කකුබ් / කකුප් | කකුභෞ | කකුභඃ | ප්‍ර—(ලි)—*N.* |
| කකුභම් | කකුභෞ | කකුභඃ | ද්වි— (ක)-*ACC.* |
| කකුභා | කකුබ්භ්‍යාම් | කකුබ්භිඃ | තෘ-(ක)—*I.* |

ඉත්‍යාදී—

"කකුභ්"ශබ්දයෙන් දිසාවත් කියත්—

එවම් අනුෂ්ටුභ් ත්‍රිෂ්ටුභ් ප්‍රභෘතයඃ † —

ධකාරාන්ත ස්ත්‍රීලිඞ්ගඃ සමිධ් ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| සමිද් / සමිත් | සමිධෞ | සමිධඃ | ප්‍ර—(ලි)—*N.* |
| සමිධම් | සමිධෞ | සමිධඃ(ඉත්‍යාදි) | ද්වි—(ක)-*ACC.* |

"සමිධ්" ශබ්දයෙන් දර කියත්—

එවං ක්ෂුධ් යුධ් ප්‍රභෘතයඃ ‡ —

චකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො වාච් ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| වාග් / වාක් | වාචෞ | වාචඃ [ඉත්‍යාදි] | ප්‍ර—(ලි)—*N.* |

---

* පූර්, නුවරය; ධූර්, භාරය.

† අනුෂ්ටුභ්, අටවෙනි ඡන්දසය; ත්‍රිෂ්ටුභ්, එකොළොස්වන ඡන්දසය.

‡ ක්ෂුධ්, කුසගින්නය; යුධ්, යුද්ධය.

"වාච්"ශබ්දයෙන් වාග් දෙවිය කියත් —

එවම් සෘච් රුච් ශුච් ප්‍රභෘතයඃ * —

ශකාරාන්ත ස්ත්‍රීලිඞ්ගො දිශශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| දිශ් | දිශෞ | දිශඃ [ඉත්‍යාදි] | ප්‍ර—(ලි)—N. |

"දිශ්"ශබ්දයෙන් දිශාවන් කියත් —

එවං දෘශ් යාදෘශ් ප්‍රභෘතයඃ † —

ඉති හලන්ත ස්ත්‍රීලිඞ්ග සාමාන්‍ය ශබ්දඃ.

---

අථ හලන්ත ස්ත්‍රීලිඞ්ග විශෙෂ ශබ්දඃ.

හකාරාන්ත ස්ත්‍රීලිඞ්ග උපානග් ශබ්දඃ —

| | | | |
|---|---|---|---|
| උපානද් / උපානත් | උපානහෞ | උපානහඃ [ඉත්‍යාදි] | ප්‍ර—(ලි)—N. |

"උපානග්" ශබ්දයෙන් වහන් කියත් —

පකාරාන්තා ස්ත්‍රීලිඞ්ගඃ අප් ශබ්දො බහුවචනාන්තඃ —

ආපඃ, අපඃ, අද්භිඃ, අද්භ්‍යඃ, අද්භ්‍යඃ, අපාම්, අප්සු —

"අප්" ශබ්දයෙන් පැන් කියත් —

සකාරාන්ත ස්ත්‍රීලිඞ්ග ආශිශ්ශබ්දඃ —

| | | | |
|---|---|---|---|
| ආශීඃ | ආශිෂෞ | ආශිෂඃ [ඉත්‍යාදි] | ප්‍ර—(ලි)—N. |

"ආශිස්" ශබ්දයෙන් ඉෂ්ට ප්‍රාර්ථනාව කියත් —

ඉති හලන්ත ස්ත්‍රීලිඞ්ග විශෙෂ ශබ්දඃ.

---

අථාජන්ත ක්ලීවලිඞ්ග සාමාන්‍යශබ්දඃ.

අකාරාන්ත ක්ලීවලිඞ්ගො ඥානශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| ඥානම් | ඥානෙ | ඥානානි | ප්‍ර—(ලි)—N. |
| [හෙ]ඥාන | [හෙ]ඥානෙ | [හෙ]ඥානානි | සම්-(ආ)—V. |
| ඥානම් | ඥානෙ | ඥානානි | ද්වි—(ක)-ACC. |

---

* සෘච්, සාග්වෙදය; රුච්, දීප්තිය; ශුච්, ශොකය.

† දෘශ්, ඇසය; යාදෘශ්, සම්බඳුය.

ශෙෂං නරශබ්දවත්.

"ඥන" ශබ්දයෙන් ප්‍රඥව කියත්.

කුලකොශලතාරුණ්‍ය හිරණ්‍ය භවනාදයඃ.

ධනධාන්‍ය ඵලාරණ්‍ය දයොපිඥන ශබ්දවත්. *

ඉකාරාන්ත නපුංසකලිංග වාරිශබ්දඃ.

| ඒකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| වාරි | වාරිණී | වාරීණි | ප්‍ර—(ලි)—N. |
| (හෙ)වාරෙ (හෙ)වාරි | (හෙ)වාරිණී | (හෙ)වාරීණි | සම්-(ආ)—V. |
| වාරි | වාරිණී | වාරීණි | ද්වි—(ක)-ACC. |
| වාරිණා | වාරිභ්‍යාම් | වාරිභිඃ | තෘ-(ක)--I. |
| වාරිණෙ | වාරිභ්‍යාම් | වාරිභ්‍යඃ | ච—(ස)--D. |
| වාරිණඃ | වාරිභ්‍යාම් | වාරිභ්‍යඃ | ප—(අ)-ABL. |
| වාරිණඃ | වාරිණොඃ | වාරීණාම් | ෂ--(ස)—G. |
| වාරිණි | වාරිණොඃ | වාරිෂු | ස—(ආ)—L. |

"වාරි"ශබ්දයෙන් ජලය කියත්.

එවං කරාඩ්ග්‍ර ප්‍රභෘතයඃ †

උකාරාන්ත නපුංසකලිංග මධුශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| මධු | මධූනි | මධූනි | ප්‍ර—(ලි)—N. |
| (හෙ)මධො (හෙ)මධු | (හෙ)මධූනි | (හෙ)මධූනි | සම්-(ආ)—V. |
| මධු | මධූනි | මධූනි | ද්වි—(ක)-ACC. |

ශෙෂං වාරිශබ්දවත්.

"මධු"ශබ්දයෙන් මී කියත්.

---

* කුල, වංශය; කොශල, නිපුණ බවය; තාරුණ්‍ය, තරුණ බවය; හිරණ්‍ය, රත්රන්ය; භවන, ගෙය (යනාදී) ආදයඃ, (මේ) ආදී ශබ්දයෝද; ධන, ධනය; ධාන්‍ය, ධාන්‍යය; ඵල, ලාභය; අරණ්‍ය, වනය (යනාදී) ආදයඃඅපි, (මේ) ආදී ශබ්දයෝද; ඥන ශබ්දවත්, ඥන ශබ්දය මෙනි.

† කරාඩ්ග්‍ර, හස්තපාදය.

එවම් අම්බු ජතු ප්‍රභෘතයඃ * —

තනු ශබ්දෝ, මධුශබ්දවත්—චතුර්ථ්‍යාදිෂු විශේෂඃ.

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| තනුනෙ<br>තනවෙ | තනුභ්‍යාම් | තනුභ්‍යඃ | ච-- (ස)—*D.* |
| තනුනඃ<br>තනොඃ | තනුභ්‍යාම් | තනුභ්‍යඃ | ප-- (අ)-*ABL.* |
| තනුනඃ<br>තනොඃ | තනුනොඃ<br>තන්වොඃ | තනූනාම් | ෂ-- (ස)--*G.* |
| තනුනි<br>තනෞ | තනුනොඃ<br>තන්වොඃ | තනුෂු | ස—(ආ)—*L.* |

"තනු"ශබ්දයෙන් තුනී යනඅර්ථ කියත්—

එවං ලඝු ගුරු ප්‍රභෘතයඃ † —

ඍකාරාන්ත ක්ලීවලිංගො ඥාතෘ ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| ඥාතෘ | ඥාතෘණී | ඥාතෘණි | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)ඥාතෘ<br>(හෙ)ඥාතඃ | (හෙ)ඥාතෘණී | (හෙ)ඥාතෘණි | සම්-(ආ)--*V.* |
| ඥාතෘ | ඥාතෘණී | ඥාතෘණි | ද්වි-- (ක)-*ACC.* |
| ඥාතෘණා<br>ඥාත්‍රා | ඥාතෘභ්‍යාම් | ඥාතෘභිඃ | තෘ- (ක)—*I.* |

ඉත්‍යාදි පුංවත් ක්ලීබවච්ච රූපම්—

"ඥාතෘ"ශබ්දයෙන් දන්නවුන් කියත්—

එවං ධාතෘ කර්තෘ ප්‍රභෘතයඃ ‡ —

ඉත්‍යජන්ත ක්ලීවලිංග සාමාන්‍ය ශබ්දාඃ.

---

අථාජන්ත ක්ලීවලිංග විශේෂ ශබ්දාඃ—

අකාරාන්ත ක්ලීවලිංගො 'ජර ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| අජරම් | අජරෙ<br>අජරසී | අජරාණි<br>අජරාංසි | ප්‍ර— (ලි)—*N.* |

---

* අම්බු, ජලය; ජතු, අංස සනාධිය.

† ලඝු, සැහැල්ලුය; ගුරු, බරය.

‡ ධාතෘ දරන්නේ; කර්තෘ, කරන්නේ.

| | | | |
|---|---|---|---|
| (හෙ)අජර | (හෙ)අජරෙ / (හෙ)අජරසි | (හෙ)අජරාණි / (හෙ)අජරාංසි | සම්-(ආ)—*V*. |
| අජරම් / අජරසම් | අජරෙ / අජරසි | අජරාණි / අජරාංසි | දි— (ක)-*ACC*. |

ශෙෂං නිජ්ජර ශබ්දවත්—

"අජර"ශබ්දයෙන් ජරා නැත්තවුන් කියත්—

| | | | |
|---|---|---|---|
| විශ්වපම් | විශ්වපෙ | විශ්වපානි | ප්‍ර—[ලි]—*N*. |

ඉත්‍යාදිකූන ශබ්දවත්—

සුධී ශබ්දො භාෂිත පුංසකඃ.

තස්මාත් තෘතියාදිෂු පුංවත් කල්පවච්චරූපම්—

| | | |
|---|---|---|
| සුධියා / සුධිනා | සුධීභ්‍යාම් | සුධීභිඃ (ඉත්‍යාදි)— |

ප්‍රධී ශබ්දශ්ච තථා—

| | | |
|---|---|---|
| ප්‍රධ්‍යා / ප්‍රධිනා | ප්‍රධිභ්‍යාම් | ප්‍රධිභිඃ (ඉත්‍යාදි)— |

ඉකාරාන්ත ක්ලීවලිඞ්ගො දධිශබ්දස්‍යතෘතියාදිෂු විශෙෂඃ.

| | | | |
|---|---|---|---|
| දධිනා | දධිභ්‍යාම් | දධිභිඃ | තෘ- (ක)--*I*. |
| දධ්නෙ | දධිභ්‍යාම් | දධිභ්‍යඃ | ච—(ස)--*D*. |
| දධ්නඃ | දධිභ්‍යාම් | දධිභ්‍යඃ | ප—(අ)-*ABL*. |
| දධ්නඃ | දධ්නොඃ | දධ්නාම් | ෂ— (ස)--*G*. |
| දධ්නි / දධනි | දධ්නොඃ | දධිෂු | ස—(ආ)--*L*. |

"දධි"ශබ්දයෙන් දී කියත්—

එවම් අස්ථි සක්ථි අක්ෂි * —

ඉත්‍යජන්ත ක්ලීවලිඞ්ග විශෙෂ ශබ්දාඃ—

---

අථ හලන්ත ක්ලීවලිඞ්ග සාමාන්‍යශබ්දාඃ

නකාරාන්ත ක්ලීවලිඞ්ගො බ්‍රහ්මන් ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| බ්‍රහ්ම | බ්‍රහ්මණී | බ්‍රහ්මාණි | ප්‍ර—(ලි)—*N*. |
| (හෙ)බ්‍රහ්ම / [හෙ,බ්‍රහ්මන්] | (හෙ)බ්‍රහ්මණී | (හෙ)බ්‍රහ්මාණි | සම්-(ආ)-*V*. |
| බ්‍රහ්ම | බ්‍රහ්මණී | බ්‍රහ්මාණි | දි--(ක)-*ACC*. |

---

* අස්ථි, ඇටය; සක්ථි, කලවය; අක්ෂි, ඇසය.

ශෙෂමාත්මත් ශබ්දවත්—

“බ්‍රහ්මන්” ශබ්දයෙන් වෙදය කියත්—

එවං චර්මන් මර්මන් නර්මන් ප්‍රභෘතයඃ * —

නකාරාන්ත ක්ලීවලිඞ්ගො ශුනින් ශබ්දඃ.

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ශුනි | ශුනිනී | ශුනීනි | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)ශුනි<br>(හෙ)ශුනින් | (හෙ)ශුනිනී | (හෙ)ශුනීනි | සම්-(ආ)—*V.* |
| ශුනි | ශුනිනී | ශුනීනි | ද්වි—(ක)-*ACC.* |

ශෙෂං ධනින් ශබ්දවත්—

එවං ගුණින් යශස්වින් වාග්මින් ප්‍රභෘතයඃ—

ජකාරාන්ත ක්ලීවලිඞ්ගො ‘අසෘජ් ශබ්දඃ.

| | | |
|---|---|---|
| අසෘග්<br>අසෘක් | අසෘජී | අසෘඤ්ජි (ඉත්‍යාදි)— |

“අසෘජ්” ශබ්දයෙන් රුධිරය කියත්—

තකාරාන්ත ක්ලීවලිඞ්ග ශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| දදත් | දදතී | දදන්ති<br>දදති | ප්‍ර—[ලි]—*N.* |

පූනයනමත් ශෙෂං පුංවත්—

එවං ජක්ෂත් ජාග්‍රත් ප්‍රභෘතයඃ.

| | | | |
|---|---|---|---|
| තුදත් | තුදන්තී<br>තුදතී | තුදන්ති | ප්‍ර—(ලි)—*N.* |

පූනාතමත් ශෙෂං දදච්ඡබ්දවත්—

“තුදත්” ශබ්දයෙන් පෙළන්නේ යන අර්ථකියත්—

එවං භාත් ප්‍රභෘතයඃ † —

| | | | |
|---|---|---|---|
| පචත් | පචන්තී ‡ | පචන්ති | ප්‍ර—(ලි)-*N.* |

---

* චර්මන්, සන්නාහය; මර්මන්, සන්ධිස්ථානය; නර්මන්, ක්‍රීඩාව.

† භාත්, බබලන්නේ.

‡ “ශප්ශ්‍යනොර්නිත්‍යම්” යන පාණිනි සූත්‍රයෙන්වූ ‘නුමාගමය’ නිත්‍යහෙයින් “පචන්තී” යන ද්විවචන රූපයමුත් “පචතී” යී ද්විවචන රූප සිද්ධියක් නොවේ.

ආශුබොධ සූත්‍රොදාහරණයෙහි පෙනෙන “පචතී” යන ද්විවචන රූපය ප්‍රමාදදොෂයකැයි සිතමු.

පුනසතමත් ශෙෂං පුංවත්-

එවං අව්‍යත් ගව්‍යත් ප්‍රභෘතයඃ-

සකාරාන්ත ක්ලිව්ලිඞ්ගො මනශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| මනඃ | මනසී | මනාංසි | ප්‍ර—(ලි)—N. |

පුනස්තමත් ශෙෂං වෙධශබ්දවත්-

"මනස්" ශබ්දයෙන් සිත කියත්-

එවං වයස් පයස් ප්‍රභෘතයඃ *

ඉතිහලන්ත ක්ලිව්ලිඞ්ග සාමාන්‍ය ශබ්ද,ඃ.

---

අථහලන්ත ක්ලිව්ලිඞ්ග විශෙෂ ශබ්ද,ඃ-

නකාරාන්ත ක්ලිව්ලිඞ්ගො 'ගන් ශබ්දඃ.

| එකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| අඝඃ | අඝනී / අඝනි | අඝානි | ප්‍ර -(ලි)—N. |
| අඝඃ | අඝනී / අඝනි | අඝානි | ද්වි-- (ක) ACC. |
| අඝනා | අඝොභ්‍යාම් | අඝොභිඃ | තෘ- (ක)—I. |
| අඝනෙ | අඝොභ්‍යාම් | අඝොභ්‍යඃ | ච— (ස)—D. |
| අඝනඃ | අඝොභ්‍යාම් | අඝොභ්‍යඃ | ප— (අ)-ABL. |
| අඝනඃ | අඝනොඃ | අඝනාම් | ෂ— (ස)—G. |
| අඝනි / අඝනි | අඝනොඃ | අඝඃසු | ස—(ආ)—L. |

"අඝන්" ශබ්දයෙන් දිනය කියත්-

සකාරාන්ත ක්ලිව්ලිඞ්ගො ධනුශබ්දඃ.

| | | | |
|---|---|---|---|
| ධනුඃ | ධනුෂී | ධනූංෂි (ඉත්‍යාදි) | ප්‍ර—(ලි)—N. |

"ධනුස්" ශබ්දයෙන් දුනු කියත්-

එවං චක්‍ෂුස් හවිස් ප්‍රභෘතයඃ †

ඉති හලන්ත ක්ලිව්ලිඞ්ග විශෙෂ ශබ්ද,ඃ.

---

* වයස්, වයසය; පයස්, ජලය.

† චක්‍ෂුස්, ඇසය; හවිස්, ගොමය.

## අථ සර්වනාම ශබ්දාඃ.

සර්ව, විශ්ව, උභ, උභය, ඩතර-ඩතම-ප්‍රත්‍යයාන්ත, ඉතර, අන්‍ය, අන්‍යතර, ත්වත්, ත්ව, නෙම, සම, සිම, පූර්ව, පර, අවර, දක්ෂිණ, උත්තර, අපර, අධර, ස්ව, අන්තර, ත්‍යද්, තද්, යද්, එතද්, අදස්, ඉදම්, එක, ද්වි, යුෂ්මද්, අස්මද්, භවත්, කිම්, ඉති සර්වාදිඃ—

### අකාරාන්තඃ සර්ව ශබ්දඃ--පුංසි—

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| සර්වඃ | සර්වෞ | සර්වේ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)සර්ව | (හෙ)සර්වෞ | (හෙ)සර්වේ | සම්-(ආ)—*V.* |
| සර්වම් | සර්වෞ | සර්වාන් | ද්වි—(ක)-*ACC.* |
| සර්වේණ | සර්වාභ්‍යාම් | සර්වෛඃ | තෘ- (ක)—*I.* |
| සර්වස්මෛ | සර්වාභ්‍යාම් | සර්වේභ්‍යඃ | ච—(ස)—*D.* |
| සර්වස්මාත් | සර්වාභ්‍යාම් | සර්වේභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| සර්වස්‍ය | සර්වයොඃ | සර්වේෂාම් | ෂ—(ස)—*G.* |
| සර්වස්මින් | සර්වයොඃ | සර්වේෂු | ස—(ආ)—*L.* |

### ස්ත්‍රියාම්—[ආකාරාන්තඃ.]

| | | | |
|---|---|---|---|
| සර්වා | සර්වේ | සර්වාඃ | ප්‍ර—(ලි)—*N.* |
| (හෙ)සර්වේ | [හෙ]සර්වේ | [හෙ]සර්වාඃ | සම්-(ආ)—*V.* |
| සර්වාම් | සර්වේ | සර්වාඃ | ද්වි--(ක)-*ACC.* |
| සර්වයා | සර්වාභ්‍යාම් | සර්වාභිඃ | තෘ- (ක)--*I.* |
| සර්වස්‍යෛ | සර්වාභ්‍යාම් | සර්වාභ්‍යඃ | ච— (ස)-*D.* |
| සර්වස්‍යාඃ | සර්වාභ්‍යාම් | සර්වාභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| සර්වස්‍යාඃ | සර්වයොඃ | සර්වාසාම් | ෂ— (ස)--*G.* |
| සර්වස්‍යාම් | සර්වයොඃ | සර්වාසු | ස—(ආ)—*L.* |

### ක්ලීබෙ—

| | | | |
|---|---|---|---|
| සර්වම් | සර්වේ | සර්වාණි | ප්‍ර— (ලි)—*N.* |
| (හෙ)සර්ව | (හෙ)සර්වේ | (හෙ)සර්වාණි | සම්-(ආ)—*V.* |
| සර්වම් | සර්වේ | සර්වාණි | ද්වි—(ක)-*ACC.* |

ශෙෂං පුංවත්—එවං විශ්වාදයො ’ප්‍යදන්තාඃ * —

---

* විශ්වාදයඃ, විශ්වශබ්දාදිවූ; අදන්තාඃඅපි, අකාරාන්ත (සර්වනාම) ශබ්දයෝද; එවම්, මෙසේමැයි—

"සර්ව" ශබ්දයෙන් සියල්ල කියත්—

උභශබ්දෝ නිත්‍යං ද්විවචනාන්තඃ—

උභය ශබ්දෝ ද්විවචන රහිතඃ—

නෙම ශබ්දඃ ප්‍රථමා සම්බෝධනයෝර්විශෙෂඃ.

| ඒකවචන. S. | ද්විවචන. D. | බහුවචන. P. | විභක්ති. C. |
|---|---|---|---|
| නෙමඃ | නෙමෞ | නෙමෙ / නෙමාඃ | ප්‍ර-(ලි)—N. |
| (හෙ)නෙම | (හෙ)නෙමෞ | (හෙ)නෙමෙ / (හෙ)නෙමාඃ | සම්-(ආ)—V. |

ශෙෂං සර්ව ශබ්දවත්—

"නෙම" ශබ්දයෙන් අර්ධය කියත්—

පූර්වශබ්දෝ නෙම ශබ්දවත්.

පුංසිකලිංගෙච පඤ්චමී සප්තම්‍යෝර්විශෙෂඃ.

| | | | |
|---|---|---|---|
| පූර්වස්මාත් / පූර්වාත් | පූර්වාභ්‍යාම් | පූර්වේභ්‍යඃ | ප--(අ)-ABL. |
| පූර්වස්මින් / පූර්වේ | පූර්වයෝඃ | පූර්වේෂු | ස—(ආ)—L. |

"පූර්ව" ශබ්දයෙන් පූර්වය කියත්—

එවං පරාදයෝ 'න්තර පර්‍යන්තාඃ *—

ත්‍යදාදෙඃ සම්බෝධනං නාස්ති—

දකාරාන්තස්තච්ඡබ්දඃ—පුංසි.—

| | | | |
|---|---|---|---|
| සඃ | තෞ | තෙ | ප්‍ර—(ලි)—N. |
| තම් | තෞ | තාන් | ද්වි—(ක)—ACC. |
| තෙන | තාභ්‍යාම් | තෛඃ | තෘ-(ක)--I. |
| තස්මෛ | තාභ්‍යාම් | තෙභ්‍යඃ | ච--(ස)-D. |
| තස්මාත් | තාභ්‍යාම් | තෙභ්‍යඃ | ප—(අ)-ABL. |
| තස්‍ය | තයෝඃ | තෙෂාම් | ෂ--(ස)-G. |
| තස්මින් | තයෝඃ | තෙෂු | ස—(ආ)--L. |

ස්ත්‍රියාම්.—

* පරාදයඃ, පරශබ්දය ආදිකොටඇති; අන්තර පර්‍යන්තාඃ, අන්තර ශබ්දය අන්තකොට ඇත්තාහු; එවම්, මෙසේමැයි—

| එකවචන. | ද්විවචන. | බහුවචන: | විභක්ති. |
|---|---|---|---|
| S. | D. | P. | C. |
| සා | තෙ | තාඃ | ප්‍ර— (ලි)-N. |
| තාම් | තෙ | තාඃ | ද්වි—(ක)-ACC. |
| තයා | තාභ්‍යාම් | තාභිඃ | තෘ-(ක)—I. |
| තස්‍යෛ | තාභ්‍යාම් | තාභ්‍යඃ | ච—(ස-)-D. |

ඉත්‍යාදි—සර්වා ශබ්දවත්—

ක්ලීබෙ—

| | | | |
|---|---|---|---|
| තත් | තෙ | තානි | ප්‍ර—(ලි)-N. |

ද්විතීයාවත්—ශෙෂං පුංවත්—

එවං ත්‍යච්ඡබ්දඃ—පුංසි—

| | | | |
|---|---|---|---|
| ස්‍යඃ | ත්‍යෞ | ත්‍යෙ | ප්‍ර—(ලි)-N. |
| ත්‍යම් | ත්‍යෞ | ත්‍යාන්.(ඉත්‍යාදි) | ද්වි—(ක)- ACC. |

ස්ත්‍රියාම්—

| | | | |
|---|---|---|---|
| ස්‍යා | ත්‍යෙ | ත්‍යාඃ[ඉත්‍යාදි] | ප්‍ර— (ලි)-N. |

ක්ලීබෙ—

| | | | |
|---|---|---|---|
| ත්‍යත් | ත්‍යෙ | ත්‍යානි(ඉත්‍යාදි) | ප්‍ර— (ලි)-N. |

"තද්" ශබ්දයෙන්ද "ත්‍යද්" ශබ්දයෙන්ද එයයන අර්ථකියත්.

| | | | |
|---|---|---|---|
| යඃ | යෞ | යෙ | ප්‍ර—(ලි)-N. |

ඉත්‍යාදි ලිඞ්ගත්‍රයෙ තච්ඡබ්දවත්—

"යද්" ශබ්දයෙන් යමක් යන අර්ථ කියත්—

දකාරාන්ත එතච්ඡබ්දඃ—පුංසි—

| | | | |
|---|---|---|---|
| එෂඃ | එතෞ | එතෙ | ප්‍ර--(ලි)—N. |
| එතම් / * එනම් | එතෞ / එනෞ | එතාන් / එනාන් | ද්වි—(ක)—ACC. |
| එතෙන / එනෙන | එතාභ්‍යාම් | එතෛඃ | තෘ- (ක)—I. |
| එතස්මෛ | එතාභ්‍යාම් | එතෙභ්‍යඃ | ච—(ස)--D. |
| එතස්මාත් | එතාභ්‍යාම් | එතෙභ්‍යඃ | ප--(අ)-ABL. |
| එතස්‍ය | එතයොඃ / එනයොඃ | එතෙෂාම් | ෂ-- (ස)--G. |

* මෙහි "එන" යනු "එතද්—ඉදම්" යන ශබ්දදෙකට 'අන්වාදෙශ' යෙහි වන ආදෙශයයි.

'අන්වාදෙශ' නම් කිවාහුගේ නැවත කිමයි—ඒ මෙසේයි ☞ 'එතෙනනාත්‍යයො"ඹිනොවෙදමෙනමධ්‍යාපය"—

| | | | |
|---|---|---|---|
| එතස්මින් | එතයෝඃ / එනයෝඃ | එතෙෂු | ස—(ආ)—*L.* |

සත්‍රියාම්

| | | | |
|---|---|---|---|
| එෂා | එතෙ | එතාඃ | ප්‍ර—(ලි)-*N.* |
| එතාම් / එනාම් | එතෙ / එනෙ | එතාඃ / එනාඃ | ද්වි—(ක) *ACC.* |
| එතයා / එනයා | එතාභ්‍යාම් | එතාභිඃ(ඉත්‍යාදි)තෘ-(ක)—*I.* | |

කලීවෙ

| | | | |
|---|---|---|---|
| එතත් | එතෙ | එතානි | ප්‍ර—(ලි)—*N.* |
| එතත් / එනත් | එතෙ / එනෙ | එතානි / එනානි | ද්වි--(ක)-*ACC.* |

ශෙෂං පුංවත්

සකාරාන්තො 'අදශ්ශබ්දඃ—පුංසි

| එකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| අසෞ | අමූ | අමී | ප්‍ර—(ලි)—*N.* |
| අමුම් | අමූ | අමූන් | ද්වි—(ක)-*ACC.* |
| අමුනා | අමූභ්‍යාම් | අමීභිඃ | තෘ-(ක)—*I.* |
| අමුෂ්මෛ | අමූභ්‍යාම් | අමීභ්‍යඃ | ච--(ස)- *D.* |
| අමුෂ්මාත් | අමූභ්‍යාම් | අමීභ්‍යඃ | ප—(අ)-*ABL.* |
| අමුෂ්‍ය | අමුයෝඃ | අමීෂාම් | ෂ—(ස)—*G.* |
| අමුෂ්මින් | අමුයෝඃ | අමීෂු | ස—(ආ)—*L.* |

සත්‍රියාම්

| | | | |
|---|---|---|---|
| අසෞ | අමූ | අමූඃ | ප්‍ර—(ලි)—*N.* |
| අමූම් | අමූ | අමූඃ | ද්වි—(ක)-*ACC.* |
| අමුයා | අමූභ්‍යාම් | අමූභිඃ | තෘ-(ක)—*I.* |
| අමුෂ්‍යෛ | අමූභ්‍යාම් | අමූභ්‍යඃ[ඉත්‍යාදි]ච--(ස)--*D.* | |

කලීවෙ

| | | | |
|---|---|---|---|
| අදඃ | අමූ | අමූනි | ප්‍ර—[ලි]—*N.* |

පුනසතවත්—ශෙෂං පුංවත්

මකාරාන්ත ඉදම් ශබ්දඃ

අසන්‍යපාස්ථාදෙශෙ එතච්ඡබ්දවද්‍රූපම්—පුංසි

| | | | |
|---|---|---|---|
| අයම් | ඉමෞ | ඉමෙ | ප්‍ර--(ලි)--*N.* |
| ඉමම් | ඉමෞ | ඉමාන් | ද්වි—(ක)-*ACC.* |

| | | | |
|---|---|---|---|
| අනෙන | ආභ්‍යාම් | එභිඃ | තෘ-(ක)—I. |
| අස්මෛ | ආභ්‍යාම් | එභ්‍යඃ | ච—(ස)--D. |
| අස්මාත් | ආභ්‍යාම් | එභ්‍යඃ | ප—(අ)—ABL. |
| අස්‍ය | අනයොඃ | එෂාම් | ෂ—(ස)—G. |
| අස්මින් | අනයොඃ | එෂු | ස (ආ) L. |

ස්ත්‍රියාම්—

| | | | |
|---|---|---|---|
| ඉයම් | ඉමෙ | ඉමාඃ | ප්‍ර—(ලි)—N. |
| ඉමාම් | ඉමෙ | ඉමාඃ | ද්වි—(ක)-ACC. |
| අනයා | ආභ්‍යාම් | ආභිඃ | තෘ-(ක)—I, |
| අස්‍යෛ | ආභ්‍යාම් | ආභ්‍යඃ | ච—(ස)-D. |
| අස්‍යාඃ | ආභ්‍යාම් | ආභ්‍යඃ | ප--(අ)-ABL. |
| අස්‍යාඃ | අනයොඃ | ආසාම් | ෂ—(ස)—G. |
| අස්‍යාම් | අනයොඃ | ආසු | ස--(ආ)—L. |

ක්ලීබෙ—

| | | | |
|---|---|---|---|
| ඉදම් | ඉමෙ | ඉමානි | ප්‍ර—[ලි]—N. |

පුනස්තමත්—ශෙෂං පුංවත්—

"එතද්, ඉදම්, අදස්" යන ශබ්දත්‍රයෙන් මෙයහිනෑව කියත්. *

එකශබ්දඃ සර්ව ශබ්දවත්—සඞ්ඛ්‍යාවාචකශ්චෙත්තර්හිත්‍යමෙක වචනාන්තඃ—විශෙෂ්‍යෙ, නිත්‍යං බහුවචනාන්තඃ— පුංසි—

ද්වෞ, ද්වෞ, ද්වාභ්‍යාම්, ද්වාභ්‍යාම්, ද්වාභ්‍යාම්, ද්වයොඃ, ද්වයොඃ—

ස්ත්‍රියාං ක්ලීබෙච—ද්වෙ, ද්වෙ, ද්වාභ්‍යාම්, ඉත්‍යාදි පුංවත්—

දකාරාන්තෞ යුෂ්මදස්මච්ඡබ්දෞ ත්‍රිෂු සරූපෞ—

---

* ඉදමස්තු සන්නිකෘෂ්ටං-සමීපතර වර්ත්තිචෛතදො රූපම්, අදසස්තු විප්‍රකෘෂ්ටං-තදිතිපරොක්ෂෙවිජානීයාත්—

ඉදමස්තු, ඉදම් ශබ්දයාගේ (රූපය) වනාහි; සන්නිකෘෂ්ටං, සමීපය(වේ;) එතදඃච, එතද් ශබ්දයාගේ (රූපය) වනාහි; සමීපතර වර්ත්ති, ඉතා සමීපයෙහි පවත්නේ (වේ;) අදසස්තු, අදස් ශබ්දයාගේ (රූපය) වනාහි; විප්‍රකෘෂ්ටම්, දූර (වේ;) තත්, තද් ශබ්දය තෙම; පරොක්ෂෙඉති, නොගමුයෙහි (වේ) යයි; විජානීයාත්, දත්තේය—

| ඒකවචන. | ද්විවචන. | බහුවචන. | විභක්ති. |
|---|---|---|---|
| *S.* | *D.* | *P.* | *C.* |
| ත්වම් | යුවාම් | යූයම් | ප්‍ර--(ලි)--*N.* |
| ත්වාම්<br>ත්වා | යුවාම්<br>වාම් | යුෂ්මාත්<br>වඃ | ද්වි--(ක)-*ACC.* |
| ත්වයා | යුවාභ්‍යාම් | යුෂ්මාභිඃ | තෘ·(ක)—*I.* |
| තුභ්‍යම්<br>තෙ | යුවාභ්‍යාම්<br>වාම් | යුෂ්මභ්‍යම්<br>වඃ | ච—(ස)—*D.* |
| ත්වත් | යුවාභ්‍යාම් | යුෂ්මත් | ප--(අ)-*ABL.* |
| තව<br>තෙ | යුවයොඃ<br>වාම් | යුෂ්මාකම්<br>වඃ | ෂ—(ස)—*G.* |
| ත්වයි | යුවයොඃ | යුෂ්මාසු | ස-(ආ)—*L.* |

"යුෂ්මද්" ශබ්දයෙන් තොප යන අර්ථ කියත්—

| | | | |
|---|---|---|---|
| අහම් | ආවාම් | වයම් | ප්‍ර—(ලි)-*N.* |
| මාම්<br>මා | ආවාම්<br>නො | අස්මාත්<br>නඃ | ද්වී—[ක]-*ACC.* |
| මයා | ආවාභ්‍යාම් | අස්මාභිඃ | තෘ-(ක)—*I.* |
| මහ්‍යම්<br>මෙ | ආවාභ්‍යාම්<br>නො | අස්මභ්‍යම්<br>නඃ | ච—(ස)—*D.* |
| මත් | ආවාභ්‍යාම් | අස්මත් | ප—(අ)-*ABL.* |
| මම<br>මෙ | ආවයොඃ<br>නො | අස්මාකම්<br>නඃ | ෂ—(ස)—*G.* |
| මයි | ආවයොඃ | අස්මාසු | ස—(ආ)—*L.* |

"අස්මද්" ශබ්දයෙන් අප යන අර්ථ කියත්—

ත්වච්ඡබ්දඃ පුංසි දදච්ඡබ්දවත්—භවච්ඡබ්දො, ධීමවත්—

මකාරාන්තඃ කිම්ශබ්දස්තච්ඡබ්දවත්-පුංසි—

| | | | |
|---|---|---|---|
| කඃ | කො | කෙ (ඉත්‍යාදි) | ප්‍ර—(ලි)—*N.* |

ස්ත්‍රියාම්—

| | | | |
|---|---|---|---|
| කා | කෙ | කාඃ (ඉත්‍යාදි) | ප්‍ර—(ලි)—*N.* |

කලීවෙ—

| | | | |
|---|---|---|---|
| කිම් | කෙ | කානි | ප්‍ර—(ලි)—*N* |

පුනස්තමත්—ශේෂංපුංවත්—

"කිම්" ශබ්දයෙන් කිමෙක යන අර්ථ කියත්—

ඉති සර්වනාම ශබ්දාඃ.

### අථ සඞ්ඛ්‍යාශබ්දාඃ.

එක ශබ්දඃ සර්වාදිෂුක්තඃ—ඉකාරාන්ත ත්‍රිශබ්දඃ—
පුංසි—ත්‍රයඃ, ත්‍රීන්, ත්‍රිභිඃ, ත්‍රිභ්‍යඃ, ත්‍රිභ්‍යඃ, ත්‍රයාණාම්, ත්‍රිෂු—
ස්ත්‍රියාම්—තිස්‍රඃ, තිස්‍රඃ, තිසෘභිඃ, තිසෘභ්‍යඃ, තිසෘභ්‍යඃ, තිසෘණාම්, තිසෘෂු—

ක්ලීබෙ—ත්‍රීණි, ත්‍රීණි, ශෙෂං පුංවත්—

### රෙඵාන්තශ්චතුර් ශබ්දඃ.

පුංසි—චත්වාරඃ, චතුරඃ, චතුර්භිඃ, චතුර්භ්‍යඃ, චතුර්භ්‍යඃ, චතුර්ණාම්, චතුර්ෂු—
ස්ත්‍රියාම්—චතස්‍රඃ, චතස්‍රඃ, චතසෘභිඃ, චතසෘභ්‍යඃ, චතසෘභ්‍යඃ, චතසෘණාම්, චතසෘෂු—

ක්ලීබෙ—චත්වාරි, චත්වාරි, ශෙෂං පුංවත්—

පඤ්චන් ප්‍රභෘතයො'ෂ්ටාදශාන්තාස්ත්‍රිෂු සරූපාඃ—

### නකාරාන්තඃ පඤ්චන් ශබ්දඃ.

පඤ්ච, පඤ්ච, පඤ්චභිඃ, පඤ්චභ්‍යඃ, පඤ්චභ්‍යඃ, පඤ්චානාම්, පඤ්චසු—
එවං සප්තන් නවන් දශන් ප්‍රභෘතයො 'ෂ්ටාදශාන්තාඃ—

### ෂකාරාන්තඃ ෂෂ් ශබ්දඃ.

ෂට්, ෂට්, ෂඩ්භිඃ, ෂඩ්භ්‍යඃ, ෂඩ්භ්‍යඃ, ෂණ්ණාම්, ෂට්සු—

### නකාරාන්තො 'ෂ්ටන් ශබ්දඃ—

අෂ්ටෞ-අෂ්ට, අෂ්ටෞ-අෂ්ට, අෂ්ටාභිඃ-අෂ්ටභිඃ, අෂ්ටාභ්‍යඃ-අෂ්ටභ්‍යඃ, අෂ්ටාභ්‍යඃ-අෂ්ටභ්‍යඃ, අෂ්ටානාම්, අෂ්ටසු-අෂ්ටාසු—
විංශත්‍යාදය ආනව තෙරෙක වචනාන්තාඃ ස්ත්‍රීලිඞ්ගාඃ—
එකොන විංශතිඃ, එකොන විංශතිම්, එකොන විංශත්‍යා, ඉත්‍යාදි මති ශබ්දවත්—

එවං විංශත්‍යාදය ඉකාරාන්ත ස්ත්‍රීලිඞ්ගාඃ—

එකොන ත්‍රිංශදාදයස්තකාරාන්තා දදච්ඡබ්දවත්—

ශතං නපුංසකමෙක වචනාන්තම්—

එවං සහස්‍රමයුතං නියුතම්ප්‍රයුත මිත්‍යාදි—

කොටිඃ ස්ත්‍රියාමෙක වචනාන්තා—

ශතං සහස්‍ර මයුතං නියුතං ප්‍රයුතං (තථා,)
කොටි රර්බුද (මිත්‍යෙවං ක්‍රමාද්දශගුණොත්තරම්)—

| | |
|---|---|
| ඒක | 1 |
| ද්වි | 2 |
| ත්‍රි | 3 |
| චතුර් | 4 |
| පඤ්චන් | 5 |
| ෂෂ් | 6 |
| සප්තන් | 7 |
| අෂ්ටන් | 8 |
| නවන් | 9 |
| දශන් | 10 |
| ඒකාදශන් | 11 |
| ද්වාදශන් | 12 |
| ත්‍රයොදශන් | 13 |
| චතුර්දශන් | 14 |
| පඤ්චදශන් | 15 |
| ෂොඩශන් | 16 |
| සප්තදශන් | 17 |
| අෂ්ටාදශන් | 18 |
| ඒකොනවිංශති * | 19 |
| විංශති | 20 |
| ඒක විංශති | 21 |
| ද්වාවිංශති | 22 |
| ත්‍රයො විංශති | 23 |
| චතුර්විංශති | 24 |
| පඤ්චවිංශති | 25 |
| ෂඩ්විංශති | 26 |
| සප්තවිංශති | 27 |
| අෂ්ටා විංශති | 28 |
| ඒකොන ත්‍රිංශත් | 29 |
| ත්‍රිංශත් | 30 |
| ඒකත්‍රිංශත් | 31 |
| ද්වාත්‍රිංශත් | 32 |
| ත්‍රයස්ත්‍රිංශත් | 33 |
| චතුස්ත්‍රිංශත් | 34 |
| පඤ්චත්‍රිංශත් | 35 |
| ෂට්ත්‍රිංශත් | 36 |
| සප්තත්‍රිංශත් | 37 |
| අෂ්ටාත්‍රිංශත් | 38 |
| ඒකොන චත්වාරිංශත් | 39 |
| චත්වාරිංශත් | 40 |
| ඒකචත්වාරිංශත් | 41 |
| ද්වා චත්වාරිංශත් / ද්වි චත්වාරිංශත් | 42 |
| ත්‍රයශ්චත්වාරිංශත් / ත්‍රිචත්වාරිංශත් | 43 |
| චතුශ්චත්වාරිංශත් | 44 |
| පඤ්චචත්වාරිංශත් | 45 |
| ෂට්චත්වාරිංශත් | 46 |
| සප්ත චත්වාරිංශත් | 47 |
| අෂ්ටාචත්වාරිංශත් / අෂ්ටචත්වාරිංශත් | 48 |
| ඒකොනපඤ්චාශත් | 49 |
| පඤ්චාශත් | 50 |
| ඒක පඤ්චාශත් | 51 |
| ද්වාපඤ්චාශත්-ද්විපඤ්චාශත් | 52 |
| ත්‍රයඃ පඤ්චාශත් / ත්‍රිපඤ්චාශත් | 53 |
| චතුඃ පඤ්චාශත් | 54 |
| පඤ්චපඤ්චාශත් | 55 |
| ෂට් පඤ්චාශත් | 56 |
| සප්තපඤ්චාශත් | 57 |
| අෂ්ටාපඤ්චාශත් / අෂ්ටපඤ්චාශත් | 58 |
| ඒකොන ෂෂ්ටි | 59 |
| ෂෂ්ටි | 60 |
| ඒකෂෂ්ටි | 61 |

* මෙහි "ඒකොනවිංශති-ඒකාද්නවිංශති-ඌනවිංශති" යන ශබ්දත්‍රයද මෙන්-"ත්‍රිංශත්-චත්වාරිංශත්" ආදියෙහිද"ඒකොනත්‍රිංශත්-ඒකාද්නත්‍රිංශත්-ඌනත්‍රිංශත්" යනාදීන් යෙදියයුතුයි.

| | | | |
|---|---|---|---|
| ද්වා ෂෂ්ටි—ද්‍ව් ෂෂ්ටි ... | 62 | ද්වානවති-ද්විනවති ... | 92 |
| ත්‍රයඃ ෂෂ්ටි—ත්‍රි ෂෂ්ටි | 63 | ත්‍රයොනවති-ත්‍රිනවති | 93 |
| චතුඃ ෂෂ්ටි ... | 64 | චතුර්නවති ... | 94 |
| පඤ්ච ෂෂ්ටි ... | 65 | පඤ්චනවති ... | 95 |
| ෂට් ෂෂ්ටි ... ... | 66 | ෂණ්ණවති ... | 96 |
| සප්තෂෂ්ටි ... ... | 67 | සප්තනවති ... | 97 |
| අෂ්ටාෂෂ්ටි--අෂ්ටෂෂ්ටි | 68 | අෂ්ටානවති-අෂ්ටනවති | 98 |
| එකොන සප්තති ... | 69 | ඒකොනශත ... | 99 |
| සප්තති ... ... | 70 | ශත ... ... | 100 |
| එකසප්තති ... | 71 | ප්‍රභාතයඃ ක්‍රමාත් සඞ්ඛ්‍යාඃ— | |
| ද්වා සප්තති-ද්වි සප්තති | 72 | (ශතං දශගුණොත්තරං) | |
| ත්‍රයඃ සප්තති-ත්‍රි සප්තති | 73 | සහස්‍රම් 1000 | |
| චතුඃ සප්තති ... | 74 | | |
| පඤ්චසප්තති ... | 75 | (එවම්) | |
| ෂට් සප්තති ... | 76 | අයුත 10000 | |
| සප්තසප්තති ... | 77 | ලක්‍ෂ 100000 | |
| අෂ්ටාසප්තති-අෂ්ටසප්තති | 78 | ප්‍රයුත 1000000 | |
| එකොනාශීති ... | 79 | කොටි 10000000 | |
| අශීති ... ... | 80 | අබ්බුද 100000000 | |
| එකාශීති ... ... | 81 | අබ්ජ 1000000000 | |
| ද්වඃශීති ... ... | 82 | ඛර්ව 10000000000 | |
| ත්‍ර්‍යාශීති ... ... | 83 | නිඛර්ව 100000000000 | |
| චතුරශීති ... ... | 84 | මහාපද්ම 1000000000000 | |
| පඤ්චාශීති ... ... | 85 | ශඞ්ඛ 10000000000000 | |
| ෂඩශීති ... ... | 86 | ජලධි 100000000000000 | |
| සප්තාශීති ... ... | 87 | අනන්ත්‍ය 1000000000000000 | |
| අෂ්ටාශීති ... ... | 88 | මධ්‍ය 10000000000000000 | |
| එකොන නවති ... | 89 | පරාර්ධ 100000000000000000 | |
| නවති ... ... | 90 | ඉති ක්‍රමාද්දශගුණොත්තරාඃ | |
| එකනවති ... ... | 91 | සඞ්ඛ්‍යාඃ— | |

තථාචොක්තම්—

"එකදශශතසහස්‍රා-යුතලක්‍ෂ ප්‍රයුතකොටයඃ ක්‍රමශඃ
අබ්බුදමබ්ජංඛර්වනි-ඛර්වමහාපද්මශඞ්ඛවස්තස්මාත්—

ජලධිශ්චාන්ත්‍යංමධ්‍යං-පරාර්ධමිති දශගුණොත්තරාඃ සංඥාඃ
සඞ්ඛ්‍යායාඃ ස්ථානානාං-ව්‍යවහාරාර්ථං කෘතාඃ පූර්වෛඃ"—ඉති

(උපෙන්‍ද්‍රවජ්‍රානාම්.)

අමෘෂ්ටමත්‍රානවධානතශ්චෙද්
භවත්‍යභිඥෛඃසදසම්භකෙත්‍ය,
විචාය්‍යීතනාම්ඤඩියාං ගිතාපිං
ප්‍රමාර්ජ්ජනීයා ප්‍රමයාසුධීභිඃ—

(ශාර්දූලවික්‍රීඩිතනාම්.)

වාණීම්පාණිනි චන්ද්‍රවාර්ත්තික කෘතාං චාශ්‍රිත්‍යවිද්‍යාර්ථිභි
වෘද්ධ්‍යෛ රක්තමලාන සංවත්සරෙජෙ ම්වද්‍යුතංසාධිතඃ,
ධම්මාලොක යතීශ්වරො කෘතධරාඞ්කාත්‍යෂ්ටි ශාකෙසමං
ධම්මාරාම සමාඛ්‍යශිෂ්‍ය යතිනෙමාංශබ්දමාලාංශුභාම්—

ශ්‍රීලඞ්කාභූමිතො කෘතෙන්ද්‍ර වදසඞ්ඛ්‍යානක්‍ෂතිං චාපිසත්
ඝූනෙනදූජ්ජෘම්භ මමාත්‍ය ශෛභඃ සහයථා රාඥිමතං රක්ෂයන්,
නීඝනනවිඝන මචාමරෙන්ද්‍ර සූචිරං තංතාංච වික්ටොරියාං
ශ්‍රීමන්තාංසරූපාධිපූතන විලියම් හැන්රිග්‍රෑගොරිං නෘපම්—

(පථ්‍යාවක්ත්‍රනාම්.)

ශ්‍රෙයඃ පරාර්ථසංසිද්ධ්‍යා යජ්ජිතං කෘතයානයා
ස්වීකුර්වන්ත්වඛිලා ජීවාස්තාදභවත්‍රය සම්භවාඃ—

# ඉති සංස්කෘත ශබ්දමාලා

සමාප්තා.

## NUMERALS OF PALI LANGUAGE.

# පාලිභාසාවේ සඞඛ්‍යා ක්‍රමය.

දශස්ථානයපටන් ලක්‍ෂයදක්වා දශයෙන්වඩාද, කොටිය පටන් අසඞඛ්‍යය දක්වා සියක්ලක්‍ෂයෙන් වඩාද දතයුතුයි- ඒ මෙසේයි—දසය දසයෙන් වැඩූකල සියයෙක්වේ, සියය දසයෙන් වැඩූකල දහසෙක්වේ, මේආදීන් ලක්‍ෂයදක්වා දශ ගුණකටයුතුයි— සියක්ලක්‍ෂය කොටියෙක්වේ, කොටිසියක් ලක්‍ෂය ප්‍රකොටියෙක් වේ, ප්‍රකොටි සියක්ලක්‍ෂය කොටි ප්‍රකොටියෙක්වේ, මේආදින් අසඞඛ්‍යයදක්වා ශත ලක්‍ෂගුණ කටයුතුයි—

| | | | |
|---|---|---|---|
| එක | 1 | | |
| දස | 10 | | (ඉලක්කම්-2) |
| සත | 100 | ... ... ... ... | (3) |
| සහස්‍ස | 1000 | ... ... ... ... | (4) |
| නවුත * | 10000 | ... ... ... ... | (5) |
| ලක්ඛ | 100000 | ... .. ... ... | (6) |
| කොටි | 10000000 | ... ... ... ... | (8) |
| පකොටි | 100000000000000 | ... ... ... | (15) |
| කොටිප්පකොටි | 1000000000000000000000 | .... ... | (22) |
| නහුත | 10000000000000000000000000000 | ... | (29) |
| නින්නහුත | 100000000000000000000000000000000000 | | (36) |
| අක්ඛොභිණී | 1000000000000000000000<br>000000000000000000000 | ... ... | (43) |
| බින්දු | 1000000000000000000000000<br>0000000000000000000000000 | ... | (50) |
| අබ්බුද | 10000000000000000000000000000<br>0000000000000000000000000000 | ... | (57) |

* "නවුත" "නහුත" කියා සඞඛ්‍යා ශබ්දයෝ දෙදෙනෙක් වෙත්— එසින් දසදහස "නවුත" යයි කියාද—කොටිප්‍රකොටි සියක්ලක්‍ෂය "නහුත" යයි කියාද දතයුතුයි—

මේ සංඛ්‍යා දෙක්හි "නවුත-නහුත" යන විශෙෂයක් නැති ව "නහුත" කියාම ලෙඛක දොෂ වශයෙන් ව්‍යවහාර වී තිබේ—

| | | |
|---|---|---|
| නිරබ්බුද | 10000000000000000000000000000000<br>00000000000000000000000000000000 | (64) |
| අහහ | 100000000000000000000000000000000000<br>00000000000000000000000000000000000 | (71) |
| අබබ | 100000000000000000000000000000000000000<br>000000000000000000000000000000000000000 | (78) |
| අටට | 10000000000000000000000000000<br>00000000000000000000000000000<br>000000000000000000000000000 ... | (85) |
| සොගන්ධික | 1000000000000000000000000000000<br>0000000000000000000000000000000<br>000000000000000000000000000000 | (92) |
| උප්පල | 100000000000000000000000000000000<br>000000000000000000000000000000000<br>000000000000000000000000000000000 | (99) |
| කුමුද | 100000000000000000000000000000000000<br>000000000000000000000000000000000000<br>0000000000000000000000000000000000 | (106) |
| පුණ්ඩරික | 10000000000000000000000000000<br>0000000000000000000000000000<br>0000000000000000000000000000<br>0000000000000000000000000000 | (113) |
| පදුම | 100000000000000000000000000000<br>000000000000000000000000000000<br>000000000000000000000000000000<br>000000000000000000000000000000 | (120) |
| කථාන | 10000000000000000000000000000000<br>00000000000000000000000000000000<br>00000000000000000000000000000000<br>0000000000000000000000000000000 | (127) |
| මහා කථාන | 100000000000000000000000000000000<br>0000000000000000000000000000000000<br>0000000000000000000000000000000000<br>000000000000000000000000000000000 | (134) |
| *අසංඛෙය්‍ය | 100000000000000000000000000000000000<br>000000000000000000000000000000000000<br>000000000000000000000000000000000000<br>000000000000000000000000000000000 | (141 |

* "අසංඛෙය්‍ය" යනු කොටියෙන්මත්තෙහි විසිවෙනිවූ සංඛ්‍යා ස්ථානයබවද, එය කල්ප අසංඛ්‍යය නොවන බවද, දතයුතුයි- එයින්කිහ-පදසාධන ටීකාවෙහි-"අසංඛෙය්‍යන්ති කොටිතො උපරි ඒසතිමංගණනට්ඨානං නකප්පා සංඛෙය්‍යං" ටීකා

මෙකල මනුෂ්‍යයන්ගේ ක්‍රයවික්‍රයාදියෙහි ඉලක්කම් දසයකින් දෙළසකින් වැඩිගණනක් බොහෝසෙයින් නොපෙනේ එබැවින් ස්ථාන ක්‍රමයෙන් එක්සිය එක්සාළිසක් ඉලක්කම් වැඩෙන්නාවූ "අසඞ්ඛ්‍යය"ය දක්වා ගණන්කිම ඉතා දුෂ්කර වන්නේය—එකී සඞ්ඛ්‍යා පිණ්ඩනයකොට ලියන කියන පරිදි සුබොධවන පිණිස මෙහි දක්වනු ලැබේ-

☞ "1, 2345678, 9123456, 7891234, 5678912, 3456789, 1234567, 8912345, 6789123, 4567891, 2345678, 9123456, 7891234, 5678912, 3456789, 1234567, 8912345, 6789123, 4567891, 2345678, 91, 23456"

"එක්අසංඛ්‍යය, තෙවිසිලක්‍ෂ සිව්නවුත පන්දෑස් සසිය අට සැත්තෑ මහාකඨාන, එකානූලක්‍ෂ දෙනවුත තුන්දෑස් සාරසිය සපණස් කඨාන, අටසැත්තෑලක්‍ෂ නවනවුත එක්දෑස් දෙසිය සූතිස්පදුම, සපණස්ලක්‍ෂ සත්නවුත අටදෑස් නවසිය දෙළොස් පුණ්ඩරික, සූතිස්ලක්‍ෂ පස්නවුත සදෑස් සත්සිය නවාසූ කුමුද, දෙළොස්ලක්‍ෂ තුන්නවුත සාරදෑස් පන්සිය සත්සැට උප්පල, නවාසූලක්‍ෂ එක්නවුත දෙදෑස්තුන්සිය පන්සාළිස් සොගන්ධික, සත්සැටලක්‍ෂ අටනවුත නවදෑස් එක්සිය තෙවිසි අටට, පන්සාළිස්ලක්‍ෂ සනවුත සත්දෑස් අටසිය එකානූ අබබ, තෙවිසිලක්‍ෂසිව්නවුතපන්දෑස්සසියඅටසැත්තෑ අහහ, එකානූලක්‍ෂ දෙනවුත තුන්දෑස් සාරසිය සපණස් නිරබ්බුද, අටසැත්තෑ ලක්‍ෂනවනවුතඑක්දෑස්දෙසියසූතිස් අබ්බුද, සපණස්ලක්‍ෂ සත් නවුත අටදෑස් නවසිය දෙළොස් බිඤ්ඤ, සූතිස්ලක්‍ෂ පස්නවුත සදෑස්සත්සිය නවාසූ අක්ඛොභිණී, දෙළොස්ලක්‍ෂ තුන්නවුතසාරදෑස්පන්සියසත්සැට නින්නහුත, නවාසූලක්‍ෂ එක්නවුත දෙදෑස් තුන්සිය පන්සාළිස්නහුත, සත්සැටලක්‍ෂ අටනවුත නවදෑස් එක්සිය තෙවිසි කොටිප්‍රකොටි, පන්සාළිස්ලක්‍ෂ සනවුත සත්දෑස් අටසිය එකානූ ප්‍රකොටි, තෙවිසිලක්‍ෂ සිව්නවුත පන්දෑස් සසිය අටසැත්තෑ කොටි, එකානූ ලක්‍ෂ, දෙනවුත තුන්දෑස් සාරසිය සපණසක්"යයිදතයුතුයි.



